# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025.01.29

හිමාලි ඉඳුනිල් මිය,
ඉඳුනිල් නිවාස,
තැන්න වත්ත, ඉලුක,
කන්දේ ගෙදර, බදුල්ල.

පැමිණිලිකාරිය

01 එච්.එම්.කේ.හේරත් මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, පේසාලේ.

02 උ.පො.ප.ජේ.කේ.විතානගේ මයා,
නිරප්පේ.

03 උ.පො.ප. සංජීවනී පෙරේරා මිය,
පොලිස් අභ්‍යාස විද්‍යාලය,
මහියංගනය.

04 පො.කො.79672 ඒකනායක මයා,
පොලිස් ස්ථානය,
ඉපලෝගම.

05 කා.පො.කො. 8464 අනුරාධ මිය,
පොලිස් ස්ථානය,
මහියංගනය.

06. සිවිල් ආරක්ෂක භට 017958 කරුණාරත්නමයා,
සිවිල් ආරක්ෂක මූලස්ථානය,
රඹෑව.

වගඋත්තරකරුවන්


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.

සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451

ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74

ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82

ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996

වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලි අංකය -: HRC/HO/364/22 1 -17

පැමිණිල්ල

හිමාලි ඉඳුනිල් නමැති පැමිණිලිකාරිය විසින් 2022/01/24 දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ගොනු කරමින්, 2020/03/13 වන දින ඉපලෝගම පොලිසිය විසින් තමා මෙන්ම ලක්ෂ 45ක් වටිනා KF 9943 දරණ තමන්ගේ ජීප් රථයද අත්අඩංගුවට ගෙන පොලිස් භාරයේ රඳවා තබාගත් බවත්, එලෙස පොලිස් භාරයේ රඳවා තබාගත් කාල සීමාවේ තම ජීප් රථයේ ආරක්ෂක පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ කර, ටයර් වලින් හුළං ඉවත් කර රථයට දැඩි අලාභ හානි සිදුකර තිබූ බවත් ජීප් රථය තුළ තිබූ ලක්ෂ දහතුන හමාරකට ආසන්න වටිනාකමකින් යුත් රන් ආභරණ පොලිස් නිලධාරීන් විසින් සොරා ගැනීමෙන් තමන් හට විශාල අනර්ථයක් සිදුකර ඇති බවත් ප්‍රකාශ කර ඇත. තවදුරටත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත්තේ 2020/03/13 වන දින පැමිණිලිකාරිය ඇගේ පුද්ගලික අවශ්‍යතාවයක් සඳහා අනුරාධපුරයට පැමිණ එය අවසන් කොට නිවසට යාමට රෑබෝවී ඇති බැවින් සිය හිතවතෙකු මාර්ගයෙන් ඉපලෝගම රන්දියත හෝටලය පිළිබඳ ව දැනගෙන හෝටලයේ එදින රාත්‍රියේ ලැගුම් ගෙන ඇති අතර, එදින රාත්‍රී 10.40 ට පමණ මිලන්ග ගජනායක නැමති වෙන්වී සිටින ඇගේ සැමියා ඇතුළු පිරිසක් එම හෝටල් කාමරයේ දොර ජනෙල් කඩාගෙන ඇතුළු වී ම ඇයට දැඩි ලෙස පහරදී තුවාල සිදුකර සමූහ දූෂණයට උත්සාහ කර ඇති අතර ඇය සතු රන් ආභරණද කොල්ලකෑ බවත් එම අවස්ථාවේදී හෝටලයට පැමිණි පොලිස් නිලධාරීන් වන උප පොලිස් පරීක්ෂක ජයන්ත සහ පොලිස් කොස්තාපල් ඒකනායක (පො.කො ,79672) යන නිලධාරීන් පැමිණිලිකාරියට ප්‍රකාශ කර ඇත්තේ ඇයගේ සැමියා විසින් ඇය අනාචාරයේ හැසිරෙන බවට 119 දුරකථනයට ලද පැමිණිල්ලකට අනුව, පැමිණි බවයි.අදාළ කාමරය පරීක්ෂා කිරීමේදී පොලිස් නිලධාරීන්ට එවැනි කිසිදු පුද්ගලයකු පිළිබඳ සොයාගත නොහැකි වූ නමුත් අනාචාරී චෝදනාවට ඔවුන් තමාව අත්අඩංගුවට ගත් බවත් ඇය රැඳී සිටි කාමරයට අයුතු ඇතුළු වීමක් සිදුකර ඇයට පහර දී තුවාල සිදුකළ ඇගේ ස්වාමිපුරුෂයා ඇතුළු පිරිස සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබූ බවත් තවදුරටත් පවසා සිටියි. අත්අඩංගුවට පත් වූ පසු ඇය ඇයගේ රථයෙන්ම පොලිස් ස්ථානය වෙත ගෙන ගොස් ඉන්පසුව ඇගේ අත් බෑගය ජීප් රථය තුළ තිබියදීම ඇගේ ජීප් රථය පොලිස් භාරයට ගෙන ඇති බවත් පවසයි. පැය 18 ක නීති විරෝධී රඳවා ගැනීමකින් පසුව ඇයව නිදහස් කළ බවත් නිදහස් වූ පසු, ඇය ජීප් රථයට හානි සිදුව තිබූ ආකාරයත් එහි තිබූ ඇගේ අත්බෑගය ඇද දමා එහි වූ ආභරණ මුදල් බැංකු කාඩ්පත් ඇතුළු වටිනා භාණ්ඩ සොරකම් කර ඇති බවත් දැන ඒ බව ස්ථානාධිපති වෙත දැනුම් දී තිබේ. ඒ පිළිබඳව පැමිණිල්ලක් සටහන් කර ඇති නමුත් ඒ පිළිබඳව ද සාධනීය විමර්ශනයක් සිදුකර නොමැති බවද ඇය පවසයි. මේ පිළිබඳව කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක57962/20 නඩුවේදී ඇගේ ආරක්ෂාව උදෙසා ඇයව අත්අඩංගුවට ගැනීමක් කළ බව වග උත්තරකරුවන් ප්‍රකාශ කර සිටින නමුත් තමන් කිසිදු අවස්ථාවක එබඳු ඉල්ලීමක් නොකළ බවට පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

පරීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු

2022.12.15 පරීක්ෂණය

2022.12.15 දින පැවති පළමු පරීක්ෂණය 01 වගඋත්තරකරු සහ පෙත්සම්කාරියේ සහභාගීත්වයෙන් පැවැත් වූ අතර, එහිදී පෙත්සම්කාරිය විසින් පවසා සිටින ලද්දේ අනුරාධපුර වන්දනා ගමනක ගොස් නැවත නිවසට යෑමට ප්‍රමාණවත් කාලයක් නොමැති හෙයින් ඉපලෝගම රන්දියත හෝටලයේ කාමරයක් ලැගුම්ගෙන සිටියදී වෙන්ව සිටින ස්වාමිපුරුෂයා එම ස්ථානයට පැමිණ කලහකාරී ලෙස හැසිරුණු බවත් කාමරයේ වීදුරු ජනෙල් කඩාගෙන ඇතුළු වී තර්ජනය කර පහරදී තුවාල සිදුකර රන් ආභරණ කොල්ලකා සමූහ දූෂණයට උත්සාහ කරන ලද බවත්ය. ඉන්පසු කිසිදු හේතුවකින් තොරව කාමරයේ තනිවී සිටි පැමිණිලිකාරිය පොලිස් නිළධාරීන් පැමිණ පොලිසිය වෙත රැගෙන ගිය අතර එහිදී පැය 18ක කාලයක් රඳවාගෙන පොලිස් නිලධාරීන්ට අවශ්‍ය ආකාරයට කටඋත්තර ලබාගෙන නිදහස් කළ බවත්ය. වාහනය

පොලිස් ස්ථානයට රැගෙන ගොස් එහි යතුර පොලිස් නිලධාරී විතානගේ මහතා විසින් ලබාගත් අතර තමාගේ රත්තරන් ආභරණ එම වාහනය තුළ දමා දොර වසා යතුර ලබා ගන්නා ලද නමුත් නිදහස් කිරීමෙන් අනතුරුව වාහනයට ගොස් බලන විට වාහනයේ ආරක්ෂක පද්ධතිය කඩා ඉවත් කොට ඇති අතර වම්පස ඩ්‍රයිවින් සීට් එක අසල වීදුරුව පහත් කර එම පැත්තෙහිද රෝදය හුළං ඇර තිබූ බවයි. මේ සම්බන්ධයෙන් පොලිසියට දැනුම් දුන් නමුත් මෙවන තෙක් නිසි පරීක්ෂණයක් නොකළ බව පෙත්සම්කාරිය සඳහන් කර සිටින අතර වාහනය තුළ තිබූ රත්තරන් බඩු වලට කුමක් සිදුවූවාද යන්න කිසිදු තොරතුරක් ලැබී නොමැති බවද සඳහන් කර සිටී

ඉපලෝගම පොලිසියේ නිලධාරින් සිදු කරන ලද මේ විමර්ශනය සම්බන්ධයෙන් 01 වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, 2020.03.14 පැය 0045 ට පොලිසියට මිලන්ක නැමැත්තාගෙන් ලැබුණු 119 හදිසි ඇමතුමකට අනුව සිය බිරිඳ කැකිරාව පාරේ රන්දියත හෝටලයෙහි අනියම් පුරුෂයෙකු හා රැඳී සිටින බවට හා හෝටලය තුළ කලබලකාරී තත්ත්වයක් ඇති බවට කරුණු අනාවරණය වූ හෙයින් එදින ජංගම මුර සංචාරයෙහි යෙදී සිටි, උ.පො.ප විතානගේ ඇතුළු නිලධාරීන් එම ස්ථානයට ගොස් ඇති බවයි. එම නිලධාරීන් විසින් පැවැත්වූ විමර්ශනයේදී අනාවරණය වී ඇත්තේ මිලන්ක යන අයගේ බිරිඳ වෙනත් පුද්ගලයෙකු හා කාමරයක රැඳී සිටියදී ස්වාමිපුරුෂයා පැමිණෙන විට ඔහු ජනේලය කඩා පිටවූ බවත් ඔහු අල්ලා ගැනීමට මිලන්ක යන අයද හෝටලයේ වීදුරුවක් කඩා දැමූ බවත් මින් සිදුවූ අලාභය හෝටලයට මිලන්ක විසින් ගෙවා දැමූ බවත්ය. මිලන්ග ගජනායක නැමැත්තා 2020.07.07 දින ඉපලෝගම පොලිසියට දි ඇති ප්‍රකාශයක් හෝ විදුරුවක් කැඩීම සම්බන්ධව කිසිදු සඳහනක් නොමැති අතර, එය පළමු වගඋත්තරකරුගේ හුදු ප්‍රකාශයක් බව නිරීක්ෂණය වේ.

මේ අවස්ථාවේදී ඇති වූ තත්වය මත මෙම සිදුවීම පවුල් ආරවුලක් බැවින්ද, උක්ත පැමිණිලිකාරිය මෙම ප්‍රදේශයට ආගන්තුකයෙකු වූ බැවින්ද, ඇගේ ආරක්ෂාව පිණිස 2020.03.14 පැය 0504 ට පොලිස් ස්ථානයේ ආරක්ෂක මාතාව භාරයට යොමු කළ බවය. පසු දින ඇයගේ ඥාතියෙකු පොළොන්නරු ප්‍රදේශයේ සිටින බැවිනුත් මිලන්ක යන අයගෙන් කරදරයක් වේ යැයි බියක් පවතින බව පැමිණිලිකාරිය කියා සිටි බැවිනුත් ඥාතීන් පැමිණෙනතුරු ඇයව ඇගේ ආරක්ෂාව පිණිස පැය 1100 වනතෙක් පොලිස් ස්ථානයේ රඳවාගෙන සිටියත් කිසිදු අයකු නොපැමිණි හෙයින් පොලිසිය ඇප මත මුදාහැරීම සිදුකළ බවත්ය.

මෙම රඳවාතබා ගැනීම ඇගේ ආරක්ෂාව පිණිස ගත් පියවරක් බවත් පැමිණිකාරිය ප්‍රකාශ කරන ආකාරයට කිසිදු තුවාලයක් හෝ මේ සම්බන්ධව කිසිදු පැමිණිල්ලක් ඇගෙන් නොලද බවට වග උත්තරකරු ප්‍රකාශ කර සිටී.උ.පො.ප විතානගේ නිලධාරීන් 2020.03.14 දින පැය 0400 ට මේ සම්බන්ධව තොරතුරු සටහන් පොතෙහි සටහන් යොදා ඇති බවත් වැරදීමකින් පිටු අංක 87 සිට 195 දක්වා පිටුවල දිනය 14 වෙනුවට 15 ලෙස සඳහන් වී ඇති නමුත්, දවස සෙනසුරාදා ලෙස නිවැරදිව සටහන් වී ඇති බවට පවසයි. පිටු අංක 196 සිට නැවත අදාළ දිනය නිවැරදිව 2020.03.14 ලෙස සටහන් යොදා ඇති බවත් රන් භාණ්ඩ රැගෙන යෑම සම්බන්ධව ස්වාමිපුරුෂයා ගෙන්වා පැමිණිල්ල විභාග කිරීමට දෙපාර්ශ්වයම ඉදිරිපත් නොවූ බැවින් එකී පැමිණිලි විභාගය සඳහා පැමිණිල්ල ඔවුන් පදිංචි පොලිස් වසම වෙත 2020.05.05 දින ෆැක්ස් පණිවිඩයක් මගින් යොමු කර ඇති බවට 01 වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියි.

2020.12.20 දින උක්ත වගඋත්තරකාර ප්‍රකාශයට එරෙහිව විරෝධතා ලිඛිතව ගොනු කරමින් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටින්නේ ඉපලෝගම ස්ථානාධිපතිතුමා විසින් සිදු කරන ලද, සියලු ප්‍රකාශ තමා ප්‍රතික්ෂේප කරන බවය.

- ඒ අනුව ස්ථානාධිපතිතුමා මාගේ ස්වාමිපුරුෂයා ලෙස හඳුන්වන මිලංක ගජනායක යන අය වර්ෂ 2015 සිට වෙනත් කාන්තාවක් සමග ජීවත් වන බවත්, 2019.02.21 දින සිට ඔහු ගිවිසුමකට අනුව

තමන්ගෙන් වෙන්ව ජීවත්වන බවත් ඒ පිළිබඳව තමන් පොලිස් නිලධාරීන් දැනුවත් කළ බවත් පවසන අතර එකී ගිවිසුමෙහි පිටපත් ඉදිරිපත් කර සිටි.

- ස්ථානාධිපතිතුමන් පරීක්ෂණයේදී 2020.03.14 දින 0045 ට මිලන්කගෙන් ලැබුණු 119 පැමිණිල්ලක් මත තමන් අත්අඩංගුවට ගත් බව ප්‍රකාශ කරත් එකී අත්අඩංගුවට ගැනීම සැබවින්ම සිදු වූයේ 2020.03.13 රාත්‍රී 11.00 ට බවය.

- පැමිණිල්ල ලැබී ඇත්තේ කාන්තාවගේ අනාචාරි හැසිරීමක් සම්බන්ධයෙන් බවට ස්ථානාධිපතිතුමන් මුල් අවස්ථාවේ සිටම දැනුවත්ව සිටි බැවින් විමර්ශනය සඳහා මෙන්ම අත් අඩංගුවට ගැනීම සඳහා පොලිස් නිලධාරිනියක යෙදවීම සිදු කළ යුතුව තිබූ බවත් එසේ නොකිරීම හේතුවෙන් එම අවස්ථාවේ තමාව සමූහ දූෂණයට පත් කිරීමට උත්සාහ කිරීමට අදාළ කරුණු පොලිස් නිලධාරීන් හට පෙන්වීමට තමාට නොහැකි වීම තමාට සිදුවූ විශාල අනර්ථයක් බවට පැමිණිලිකාර ප්‍රකාශ කර සිටියි.

- වගඋත්තරකරු 2020.03.13 දින රාත්‍රියෙහි සිදුවූ මෙම සිදුවීම පවුල් ආරවුලක් ලෙස දැක්වීමට ඉස්මතු කිරීම තුළින් මෙහි පවත්නා අපරාධමය ස්වභාවය වසන් කිරීමට උත්සාහ කරන බවට පැමිණිලිකාරිය පවසයි.

- වගඋත්තරකරු ප්‍රකාශ කරන පරිදි ආරක්ෂාව පිණිස පැමිණිලිකාරිය පොලිස් ස්ථානයට රැගෙන ගිය බවට කරන ප්‍රකාශය ඇය ප්‍රතික්ෂේප කර සිටියි .එම ස්ථානයට බලහත්කාරයෙන්ම කඩාවැදී කලහකාරී ලෙස හැසිරුණු මිලංක ඇතුළු පුද්ගලයින් හතර දෙනා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම වෙනුවට ඔවුන්ගෙන් ප්‍රකාශ සටහන් කොට ගෙන මිලංක බැංකුවට යවා මුදල් ගෙන්වාගෙන හෝටලයේ අලාභය පියවීමට හා අත්අඩංගුවට ගත යුතු පුද්ගලයින් වන ඔවුන්ව නිදහස් කර අපරාධ වින්දිතයා වූ තමන්ව අත්අඩංගුවට ගැනීමට පොලිසිය විසින් කටයුතු කර ඇති බව ඇය තවදුරටත් පවසයි. තම ජංගම දුරකථන දෙක සහ ජීප් රථය අත්අඩංගුවට ගෙන 2020.03.13 රාත්‍රී 11.00 සිට 2020.03.14 උදෑසන 11.00 දක්වා රඳවා තබා ගනිමින් මිලන්ක නැමැත්තාට දික්කසාදය ලබා ගැනීමට අවශ්‍ය කරුණු ඇතුළත් කර ලබාගත් ප්‍රකාශයන්හි තම අත්සන ලබාගත් බවත් ඉන්පසු පොලිස් ඇප මත මුදා හැරීම සිදු කිරීම තුළ තමා අනාරක්ෂිත වූ බවත් තමාට අනර්ථයක් සිදුවූ බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

- තමන් ආරක්ෂක මාතාවක් භාරයේ තැබීමක් සිදු නොකළ බවත් ආරක්ෂක මාතාව ලවා තමා පරීක්ෂා කළේ නම් අදාළ සටහන් හෝ වාර්තා වූ ඉදිරිපත් කරන ලෙසත් ඇය පවසා සිටියි.

- ස්ථානාධිපතිතුමන්ගේ ප්‍රකාශ වලට අනුව පොළොන්නරුව ප්‍රදේශයේ තම ඥාතියෙකු ට සිටින බවට කරන ලද ප්‍රකාශයද දැඩිව ප්‍රතික්ෂේප කරන පෙත්සම්කාරිය තම දුරකථන දෙකම පොලිස් භාරයේ තිබියදී තමන් ඥාතීන් හා සන්නිවේදනය කරනුයේ කෙලෙසද යන්න පවසා සිටියි.

- අත්අඩංගුවෙන් මාස හතරකට පසු අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මගින් මා අධිකරණ වෛද්‍යතුමන් වෙත 2020.07.15 යොමු කර ලබාගත් වාර්තාවෙහි පවා සිදුවූ තුවාල පිළිබඳ කරුණු සඳහන්ව තිබූ බවත් ස්ථානාධිපතිතුමා පවසන පරිදි කිසිදු තුවාලයක් නොවූ බවට දක්වන කරුණු තමන් ප්‍රතික්ෂේප කරන බව පවසමින් පෙත්සම්කාරිය සිය විරෝධතා ගොනුකර සිටියි.

- එම අවස්ථාවේදී තමන් නැවත නැවතත් තමාව වෛද්‍යවරයෙකු වෙත යොමු කරන ලෙසටත් තමාට වෛද්‍ය වාර්තාවක් ලබාගැනීමට අවශ්‍ය බවත් ප්‍රකාශ කර සිටියත් පොලිස් නිලධාරීන් එසේ නොකළ බව පැමිණිලිකාරිය පවසයි.

2023.02.15 දින පවත්වන ලද පරීක්ෂණයට පැමිණිලිකාරියට එදින අධිකරණයේ නඩුවක් පවතින බව සඳහන් කර ලිපියක් යොමු කළ බැවින් පරීක්ෂණය කල් තබා ඇත.

නැවතත් 2023.04.06 දින මෙන්ම 2023.05.24 යන දෙදිනම පැවති පරීක්ෂණයන්ට දෙපාර්ශවයම කැඳවා තිබුණද 01 වගඋත්තරකරු හේතු දැක්වීමකින් තොරවම නොපැමිණ ඇති අතර පැමිණිලි පාර්ශවය පමණක් සහභාගි වී ඇත.

<u>2023.08.23 පරීක්ෂණය</u>

2023.08.23 පැවති පරීක්ෂණයට දෙපාර්ශවයම සහභාගි වී ඇති අතර පැමිණිලිකාරිය පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ 2023.03.13 දින තමන් ඉපලෝගම රන්දියත හෝටලයේ රැඳී සිටියදී රාත්‍රී 10.30-11.00ට පමණ තමාගෙන් වෙන්වී සිටින ස්වාමිපුරුෂයා ඇතුළු තිදෙනෙකු බලහත්කාරයෙන් ඇතුළු වී තමාට පහරදී රන්ආභරණ කොල්ලකා තමන්ව දූෂණයට උත්සාහ කළ අවස්ථාවේදී, පොලිස් නිලධාරීන් දෙදෙනෙකු එම කාමරයට ඇතුල් වූ බවත් පසුව උ.පො.ප විතානගේ කාමරයට ඇතුළුවූ බවත් ඔහු "උඹල එළියට පලයල්ල දැන් අපි ආවානේ" යනුවෙන් ස්වාමිපුරුෂයා ඇතුළු පිරිසට පැවසූ බවත්ය. එම අවස්ථාවේ එම නිලධාරියා තමාට ඇඳුම් ඇඳ ගන්නා ලෙස පවසා අත්අඩංගුවට ගත් බවත් තමා අත්අඩංගුවට ගැනීමට හේතු විමසූ නමුත් "<u>පොලිසියට ගිහිල්ලා බලාගමු</u>"„ යනුවෙන් පැවසූ බවත් පවසයි. හෝටලයට අලාභ හානි සිදුකොට තමාට පහර දුන් ස්වාමපුරුෂයා ඇතුළු පිරිස අත්අඩංගුවට ගන්නා ලෙස තමන් ප්‍රකාශ කළ සිටියත් පොලිස් නිලධාරීන් ඔවුන් අත්අඩංගුවට නොගත් බවත් පැමිණිකාරිය පවසයි.

අත්අඩංගුවට ගැනීම සිදුකරන අවස්ථාවේදී ස්වාමිපුරුෂයා විසින් රන් ආභරණ උදුරා ගැනීමේදී තමාගේ බෙල්ල හා කන ඉරී ගොස් තිබුණ නිසා ලේ ගලමින් පැවැති බවත් පොලිස් නිලධාරි ඒකනායක මහතා (4 වන වගඋත්තරකරු) තමාට තමන්ට ලේ පිහදා ගැනීමට ටිෂූ කැබැල්ලක් හෝ ලබා නොදුන් බවත් පවසයි. පසුව හෝටල් රිසෙප්ෂන් ශාලාවට තමන් කැටුව ගොස් මිලංක නැමති තම ස්වාමිපුරුෂයාගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමේ අනතුරුව බැංකුවට ගිහින් සල්ලි රැගෙන එන ලෙස උ.පො.ප විතානගේ උපදෙස් දුන් බවත් හෝටලේ අයිතිකරුට හා පහර කෑමට ලක් වූ මුරකරුට ස්වාමිපුරුෂයා විසින් මුදල් ලබා දෙනු තමා දුටු බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කරයි. තවදුරටත් පසුදින පස්වරු 12.30 පමණ වන තෙක් තමාගෙන් ප්‍රකාශ සටහන් කළ ගත් බවත්, තමා ප්‍රකාශ කළ සියලුම දේවල් පොලිස් නිලධාරීන් විසින් සටහන් නොකළ බවත් මිලන්ක නමැති තම ස්වාමිපුරුෂයා සහ පොලිස් නිලධාරීන්ට අවශ්‍ය කරුණු පමණක් සටහන් කර අත්සන් කරන ලෙසට තමාට තර්ජනය කෙරු බවත් ඇතිවූ බිය හේතුවෙන් තමන් එකී ප්‍රකාශ සියල්ලට අත්සන් කෙරූ බවත් පසුව ස්ථානාධිපතිතුමාට තමන්ට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් ප්‍රකාශ කළ නමුත් ඔහු ඒ සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවත් පවසයි.

<u>2024.03.06 පරීක්ෂණය</u>

2024.03.06 දින 1 වගඋත්තරකරු ස්ථානාධිපති හේරත් මයා, 2 වග උත්තරකරු උ.පො.ප විතානගේ මයා, 4 වගඋත්තරකරු පො.කො 79672 ඒකනායක මයා යන අයගේ සහ පැමිණිලිකාරියගේ සහභාගීත්වයෙන් තවත් පරීක්ෂණයක් පවත්වා ඇත.

මෙහිදී 02 වගඋත්තරකාර විතානගේ පවසා සිටියේ තමන් 2020.03.13 දින රාත්‍රී රාජකාරි වල යෙදී සිටියදී මිලන්ක නමැත්තාගෙන් ලැබුණු 119 පැමිණිල්ලකට අනුව ඔහුගේ බිරිඳ අනියම් පුරුෂයෙකු සමඟ රන්දියත හෝටලයේ සිටින බවට පැමිණිලි කළ බවය. තමන් එකී ස්ථානයට ගිය පසු හෝටලේ හිමිකරු සමඟ අදාළ කාමරයට ගිය අවස්ථාවේදී පැමිණිලිකාරිය බෙඩ්ෂීට් එකකින් ශරීරය ආවරණය කර සිටි බවත් පසුව ඇඳුම් ඇඳගෙන එළියට එන ලෙස තමන් ඇයට පැවසූ බවත් පවසයි. පැමිණිලිකාර කාන්තාව තමන්ට පැමිණිල්ලක් කිරීමට අනවශ්‍ය බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ඇයට රාත්‍රී කාලයේ කරදරයක් වනු ඇතැයි යන සැකය මත ඇය පැදවූ රථය ඇයටම පදවාගෙන පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස දැන්වූ බවත් එලෙස පැමිණීමෙන් පසු කාන්තාව විසින්ම තමාගේ කැමැත්තෙන් වාහනයේ යතුරු ලොක්කර යතුරු සහ ඇගේ ජංගම දුරකථන ආරක්ෂාවට පොලිස් ස්ථානයේ උපසේවකට භාර දුන් බවත් තමන් කාන්තාවගේ වටිනා දේපළ ඇය සතුවම තබාගන්නට උපදෙස් දුන් බවත් පසුව නැවත තමන් රාජකාරී සඳහා පිටත් වූ බවත් පවසයි.

04 වගඋත්තරකරු වන පො.කො 79672 ඒකනායක ප්‍රකාශ කර සිටින්නේ, තමන් උ.පො.ප විතානගේ මහතා සමග රාත්‍රී ජංගම සහායක නිලධාරියා ලෙස සේවයේ යෙදී සිටියදී ලැබුණු 119 පණිවිඩයට අනුව ඉපළෝගම රන්දියත හෝටල් සිදුවීමක් සම්බන්ධයෙන් එම ස්ථානයට ගිය අතර පණිවිඩය ලබාදුන් පුද්ගලයාගේ බිරිඳ වෙනත් පුද්ගලයෙකු සමග හෝටලය කාමරයක ඉන්නවා යැයි පවසන ලද බැවින් විතානගේ මහතා සමග එම කාමරයට ගිය බවත් විතානගේ මහතා එම කාමරය පරීක්ෂා කර ලැගුම් ගෙන සිටි කාන්තාව හෝටලයේ ප්‍රධාන ශාලාවට පැමිණි පසු විතානගේ මහතාගේ උපදෙස් පරිදි තමා එතැන සිටි පුද්ගලයන් තුන්දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ගත් බවත් පවසයි. පසුව, එම කාන්තාව පැමිණි රථය ඇය විසින්ම පදවාගෙන පොලිස් ස්ථානයට පැමිණි බවත් එකී වාහනේ පිටුපසින්ම පොලිස් ජීප් රථයද පදවාගෙන පැමිණ ඇයව තමන් විසින් පොලිස් ස්ථානයට ඉදිරිපත් කොට නැවත රාජකාරී සඳහා පිටව ගිය බවත් ඒකනායක මහතා ප්‍රකාශ කර සිටියි.

මෙදින 6 වගඋත්තරකරු සිවිල් ආරක්ෂක භට 017958 කරුණාරත්න පරීක්ෂණයට කැඳවා සිටි නමුත් නොපැමිණීමට හේතු දැක්වීමකින් තොරව ඔහු සහභාගී වී නොමැත.

2024.03.06 දින පැවැති පරීක්ෂණයේදී 02 වගඋත්තරකරු සහ 04 වගඋත්තරකරු සිදු කරන ලද ප්‍රකාශයට එරෙහිව ලිඛිත විරෝධතා ගොනු කරමින් පැමිණිලිකාරිය ප්‍රකාශ කරසිටින්නේ, 01,03,04 වගඋත්තරකරුවන් නැවත නැවතත් ප්‍රකාශ කර සිටින්නේ තමාගේ ජීවිතයට තර්ජනයක් මෙම මැර පිරිසගෙන් එල්ල වී ඇති බවට ඔවුන්ට නිරීක්ෂණය වූ බැවින් මෙම අත්අඩංගුවට ගැනීම සිදුකළ බවයි. එලෙස ජීවිත තර්ජනයක් නිරීක්ෂණය වූවා නම් එලෙස හැසිරුණු පිරිස අත්අඩංගුවට ගැනීමක් සිදු නොකිරීම හේතුවෙන් මෙම නිලධාරීන් හිතාමතා රාජකාරිය පැහැරහැර ඇති බවට පැමිණිකාරිය චෝදනා කරයි. තවදුරටත් මෙම වගඋත්තරකාර 2,4 නිලධාරීන් දෙදෙනා ප්‍රකාශ කර සිටියේ ජීප් රථය තුළ රන් භාණ්ඩ නොතිබූ බවත් තමා පොලිස් අත්අඩංගුවේ සිටියදී තමා පොලිසිය තුළදී බෑගයක් එල්ලාගෙන සිටි බවත්, පොලිසිය තුළ මිලංක විසින් තමාව වීඩියෝ ගත කරන ලද වීඩියෝවක් නිලධාරීන් සතුව තිබෙන බවත්ය. පැමිණිකාරිය තර්ක කරන්නේ පොලිස් ස්ථානය තුළ සිවිල් වැසියෙක් අත්අඩංගුවේ සිටියදී සැකකරුව වීඩියෝ ගත කිරීම නීති විරෝධී බවත් මිලංක ඇතුළු මැර පිරිසට පොලිසිය තුළදී ඔවුන්ට අභිමත පරිදි හැසිරීමට ඉඩ ලබා දීම තුළින් අපරාධකරුවන්ට වගඋත්තරකරුවන් ආධාර හා අනුබල ලබාදුන් බවයි. අපරාධකරුවන් හා නිලධාරීන් එකී වීඩියෝ පට හුවමාරු කරගනිමින් එම වීඩියෝපට යොදා ගනිමින් නිලධාරීන්ගේ වරදකාරී ක්‍රියා රන් භාණ්ඩ ඇතුළු වටිනා දෑ සොරකම වසන් කිරීමට උත්සාහ කරන බවට පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

තමන් වාහනයෙන් බැස යන බොහෝ අවස්ථාවල ජංගම දුරකථන දෙක සහ ජීප් රථයේ යතුරු ලබා ගැනීම සඳහා සයිඩ් බෑගයක් යොදා ගන්නා බවත්, සයිඩ් බෑග් එකට රන්භාණ්ඩ ඇතුලත් මංජුසාව දැමීමට නොහැකි බැවින් රන්භාණ්ඩ අසුරා තිබුණේ රථය තුල වූ හෑන්ඩ් බෑගයේ බවත් පැමිණිලිකාරිය පවසා සිටියි.

පරීක්ෂණයේදී 2,4 වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාරිය ඉපලෝගම පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදු නොකළ නිසා පැමිණිලිකාරියට තුවාල සිදු කිරීම , සමූහ දූෂණය උත්සාහ කිරීම, භාණ්ඩ මංකොල්ලකෑම අවශ්‍ය නීතිමය පියවර ගැනීමට නොහැකි වූ බව ප්‍රකාශ කරයි. එම ප්‍රකාශයද දැඩිව ප්‍රතික්ෂේප කරන පැමිණිලිකාරිය මෙකී අපරාධ සිදුවීම සමඟම නිලධාරීන් පැමිණ තමන් අත්අඩංගුවට ගත් බැවින් ජංගම දුරකථන දෙකක් අත්අඩංගුවට ගෙන පැය විසි හතරකට ආසන්න කාලසීමාවක් අත්අඩංගුවේ සිටීම හේතුවෙන් තමා හට පැමිල්ලක් සිදුකරගත නොහැකි වූ බව පවසයි. නමුත් එම සිදුවීම සම්බන්ධව මා වාචිකව දිගින් දිගටම ප්‍රකාශ කළ නමුත් ඔවුන් එකී ප්‍රකාශ සැලකිල්ලට නොගත් බවත් අත්අඩංගුවෙන් ඇපපිට නිදහස් කළ විට පොලිස් භාරයේ තිබූ තම ජීප් රථයට දැඩි ලෙස අලාභ හානි සිදුව තිබූ බැවින් ඒවා පිළිසකර කරගෙන ඉපලෝගමින් පිටත් වන විට වේලාව හවස 05.00 පමණ වූ බවත් සිද්ධියට අදාළව කැකිරාව, දඹුල්ල යන පොලිස් ස්ථානයන්ට පැමිණිලි කිරීමට ගිය නමුත් පොලිස් නිලධාරීන්ට එරෙහි එකී පැමිණිල්ල භාර ගැනීම ඔවුන් ප්‍රතික්ෂේප කළ බවත් එය පැමිණිලි කළ යුත්තේ ඉහළ ආයතනවල ඉන්නා පොලිස් නිලධාරීන් හට බවත් ඔවුන් උපදෙස් දෙන ලද බවත්පවසයි. 2020.03,14 දින කඳානේ පිහිටි තමා නිවසට පැමිණෙන විට මිලංක ඇතුළු මැර පිරිස නිවසෙහි දොරලොක් මාරු කර නිවසට ඇතුළු වීමට නොදී හැරීම හේතුවෙන් 15,16,17 දින තුනේදීම කඳාන පොලිස් ස්ථානයට ගොස් පිළිබඳ පැමිණිලි කර නිවසට ඇතුළු වීමට තමන් උත්සාහ කළ බවත් පසුව 2020.03.19 හෝ ඊට ආසන්න දිනකදී කොවිඩ් වසංගතයේ හේතුවෙන් රට පුරා සංචරණ සීමා පනවා තිබූ බැවින් තමන්ට මේ පිළිබඳව පැමිණිලි සිදු කිරීමට හැකි වූයේ සංචරණ සීමා අර්ධ ලෙස ලිහිල් කොට ලද 2020.06.07 දින ලැබූ පළමු අවස්ථාවේදී බවත් තමන් පොලිස් නිලධාරීන්ට විරුද්ධව පොලිස්පතිතුමාට හා ආරක්ෂක ලේකම්තුමාට මේ සම්බන්ධව පැමිණිලි කරමින් ලිපි යැවූ බව පවසා සිටී.

පරීක්ෂණයේදී මිලංක තමාගේ ස්වාමියා හේතුවෙන් තමන් ඔහුට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකරන ලෙස ඉල්ලූ බවට සිදු කරන ප්‍රකාශයද පැමිණිලිකාරිය දැඩිව ප්‍රතික්ෂේප කරන අතර පොලිස් නිලධාරීන් මිලන්ක බැංකුවට යවා හෝටලේ කාර්ය මණ්ඩලයට මුදල් ලබාදී අපරාධ සිදුවීම හෝටල් පරිශ්‍රයේ තුළදීම සමථ කරණයට එළඹීම හේතුවෙන් හෝටල් කළමනාකරුට මෙම සිද්ධියට අදාළව ඉදිරි නෛතික පියවර ගැනීමට නොහැකි වූ බව පැමිණිකාරිය පවසයි.

තමාට තර්ජනය කරමින් අත්සන් යෙදූ පොලිස් ස්ථානයේදී ලබාගත් ප්‍රකාශ සම්බන්ධයෙන් 2,4 වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන්නේ, ඔවුන් එලෙස තර්ජනය නොකළ බවත් සාමකාමීව තමා විසින් එකී ප්‍රකාශයන්හි අත්සන් යෙදූ බවත්ය. මෙම මැර පිරිසගෙන් පහර කෑම තුවාල ලැබීම මැර පිරිස තමන්ව සමූහ දූෂණයට උත්සාහ දැරීම ආදී හේතූන් නිසාත් කිසිදු වෛද්‍ය ප්‍රතිකාරයක් නොලද නිසාත් තමන් දැඩි ශාරීරික හා මානසික පීඩනයට පත්ව සිටි බව ප්‍රකාශ කර සිටින පැමිණිලිකාරිය තමන්ට එම ලේඛන වලට අත්සන් නොයෙදුවහොත් මත්ද්‍රව්‍යය චෝදනාවකට තමන්ව අසුකරන බවට පොලිස් නිලධාරීන් සිදු කරන ලද තර්ජනයන්ට බිය පත්ව පොලීසියට අභිමත පරිදි ලියන ලද ප්‍රකාශ වලට නඩු පවරා අත්සන යෙදූ බව පවසයි.

<u>**2023.10.08 පරීක්ෂණය**</u>

2023.10.08 දින 01,02,03,04,05,06 යන සියලු වගඋත්තරකරුවන්ගේ සහ පැමිණිලිකාරියගේ සහභාගීත්වයෙන් කොමසාරිස්තුමන් ඉදිරියෙහි සිදු කරන ලද පරීක්ෂණයේදී, පැමිණිලිකාරිය සිය පැමිණිල්ල කෙටියෙන් ප්‍රකාශ කරමින් තමාට පහර දීම රන්භාණ්ඩ නැතිවීම හා තමාව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ කාන්තා පොලිස් නිලධාරිනියක් නොසිටීම තමාට පහර දුන් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම වෙනුවට තමා සහ තමාගේ ජීප්රථය පොලිස් ස්ථානය වෙත රැගෙන යාම වගඋත්තරකාර පොලිස් නිලධාරින් විසින් සිදුකල බව ප්‍රකාශ කර ඇත.

පරීක්ෂණයේදී කොමිෂන් සභාව විසින් වගඋත්කරුවන්ගෙන් විමසන ලද්දේ, සිවිල්ආරවුලක් පවතින අවස්ථාවක කුමන නීතිමය තත්ත්වයක් යටතේ පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීම සහ පොලිස් ස්ථානය වෙත රැගෙන යෑම සිදුකරන ලද්දේද යන්නයි.

වගඋත්තරකරුවන් පිළිතුරු දෙමින් 119 වෙත ලැබුණු පැමිණිල්ලක් අනුව අදාළ විමර්ශන කටයුත්තෙහි නිරත වූ බවත් පැමිණිලිකාරියගේ ආරක්ෂාව උදෙසා පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළ බවත් පසුදින ඇයව මුදා හැරි බවත් පවසා සිටියි.

නැවතත් කොමිෂන් සභාව විසින් වගඋත්තරකාර පාර්ශවයෙන් විමසා සිටියේ අධිකරණ වෛද්‍ය පෝරමයක් පැමිණිලිකාරිය වෙත ලබා දුන්නේද යන්නයි.

වෛද්‍යවරයෙක් වෙත ඉදිරිපත් නොකළ බවත් පැමිණිකාරියගේ ආරක්ෂාවට පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් තවදුරටත් පිළිතුරු දක්වමින් වගඋත්තරකරුවන් විසින් ප්‍රකාශ කර සිටින ලදී. රන්භාණ්ඩ වලට කුමක් සිදුවීද යන්න විමසූ විට වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන්නේ පැමිණිලිකාරියගේ සියලු බඩුභාණ්ඩ නඩු භාණ්ඩ ලෙස රඳවාගෙත් බවය. පැමිණිලිකාරිය කොමිෂන් සභාව වෙතින් බලාපොරොත්තු වන සහනය වන්නේ තමන්ගේ නැතිවූ රන්භාණ්ඩ නැවත ලබා දීමත් , තමාට සාධාරණය ඉටුකර දීමත්ය.

**<u>2024.11.01 පරීක්ෂණය</u>**

2024.11.01 දින වගඋත්තරකරුවන් හය දෙනා හා පැමිණිලිකාරියගේ සහභාගීත්වයෙන් පැවති පරීක්ෂණයේදී දෙපාර්ශවයට සමථයකට එළඹිය හැකිද යන්න සාකච්ඡා කරන ලදි. එහිදී වගඋත්තරකරුවන් විසින් ඔවුන් විසින් රාජකාරී පැහැරහැරීමක් සිදුවී ඇති බව පිළිගෙන සමාව අයැද සිටීමට සූදානම් බව ප්‍රකාශ කරසිටී .එහෙත් එම අවස්ථාවේ පැමිණිලිකාරිනිය ප්‍රකාශ කර සිටියේ සමාව වාචිකව නොව ලිඛිතව ඇය වෙත ලබා දිය යුතු බවයි. අදාළ පැමිණිල්ල සම්බන්ධව ලිඛිත ලේඛන සකස් කරගෙන ඒමට වගඋත්තරකරුවන් කාලය ඉල්ලා සිටි බැවින් තවත් පරීක්ෂණ වාරයක් පැවැත්වීමට තීරණය විය.

**<u>2024.11.18 පරීක්ෂණය</u>**

2024.11.18 නැවතත් දෙපාර්ශවයම කැඳවා විමර්ශණයක් පැවැත්වූ අතර පරීක්ෂණයට පෙර මෙම සිදුවීම සම්බන්ධයෙන් ලිඛිත දේශන ඇත්නම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට වගඋත්තරකරුවන්ගෙන් සහ පැමිණිලිකාරියගෙන් ඉල්ලා සිටින ලදි. එහිදී 1,2,3,4 වගඋත්තරකරුවන් ලිඛිත දේශන සැපයූ නමුත් 5 වන වගඋත්තරකාර කා.පො.කො.8464 අනුරාධා ලිඛිත දේශන නොසැපයූ අතර හේතු දක්වමින් ලිපියක් දක්වමින් එදින පරීක්ෂණයට සහභාගී නොවන ලදි. 6 වන වගඋත්තකකරු සිවිල් ආරක්ෂක භට 017958 කරුණාරත්න මයා හේතුදැක්වීමකින් තොරවම එදින පරීක්ෂණයට සහභාගි වී නොමැත. පැමිණිලිකාරිය විසින් සිය ලිඛිත දේශනයේ සමථ කරන කොන්දේසි ඉදිරිපත් කර තිබූ අතර

නොරාවන ලදි. 6 වන වගඋත්තකරු සිවිල් ආරක්ෂක භට 017958 කරුණාරත්න මයා හේතුදැක්වීමකින් තොරවම එදින පරීක්ෂණයට සහභාගී වී නොමැත. පැමිණිලිකාරිය විසින් සිය ලිඛිත දේශනයේ සමථ කරන කොන්දේසි ඉදිරිපත් කර තිබූ අතර එකී කොන්දේසි අතරින් මුදල් සම්බන්ධ කොන්දේසියට දෙපාර්ශයවයට එකඟත්වයට එළඹීමට නොහැකි විය. ඒ අනුව සමථ කොන්දේසි ප්‍රකාරව දිවුරුම් ප්‍රකාශයන් ලබාදීමට වගඋත්තරකරුවන් එකඟත්වය පළකළද පැමිණිලිකාරිය ඉල්ලා සිටින මුදල් ප්‍රමාණය ලබා දිය නොහැකි බවට වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටින ලදි. එබැවින් පරීක්ෂණය සමථයකින් තොරවූ අතර ඒ අනුව පැමිණිල්ල තවදුරටත් විමසීමට ගන්නා ලදි.

<u>පැමිණිලිකාරිය විසින් ලිඛිත දේශන මගින් ඉදිරිපත් කරනු ලබන කරුණු</u>

- ඉපලෝගම පොලිස් නිලධාරීන් මිලංක ගජනායක යන පුද්ගලයා විසින් 119 දුරකථන අංකයට ලබා දුන් බවට ප්‍රකාශ කරන පැමිණිල්ලට අනුව තමා අත්අඩංගුවට ගෙන රඳවා තබා ගත්තද එකී පැමිණිල්ලේ සඳහන් කරුණෙහි සත්‍ය අසත්‍යභාවය පිළිබඳ විමර්ශනයක් සිදු නොකර ඔහු විසින් සිදුකළ වංචනික ව්‍යාජ පැමිණිල්ලකට අනුව මා අත්අඩංගුවට ගැනීමත් අත්අඩංගුවේ රඳවා තබාගත් කාලසීමාවේ කිසිදු වරදක් සිදු නොකළ මාගෙන් පසු දින දහවල් අසත්‍ය කරුණු ඇතුළත් කර වගඋත්තරකාර ප්‍රකාශ ලෙස ප්‍රකාශයක් සටහන් කර අත්සන් ලබා ගැනීමත් හේතුවෙන් මිලන්ක ගජනායක යන පුද්ගලයාට දික්කසාද නඩුවක් ගොනු කිරීම සඳහා අවශ්‍ය සාක්ෂියක් සකස් කර දීමට පොලිස් නිලධාරීන් ක්‍රියාකොට ඇති බවට පැමිණි පාර්ශවයන් ප්‍රකාශ කර සිටියි. තවදුරටත්, මිලංක ගජනායක නමැති මෙම සිදුවීමෙහි ප්‍රධාන චූදිතයා තමා අනාචාරියක් බව ප්‍රකාශ කරමින් කොළඹ දිසා අධිකරණයේ DDV 543/20 යන දික්කසාද නඩුව ගොනු කරමින් එහි 24 වන සහ 25 වන වගන්ති වලින් තමාහට චෝදනා කර ඇත්තේ ඉපලෝගම පොලිස් ස්ථානය සටහන් කර ඇති පැමිණිලි හා වගඋත්තරකාර ප්‍රකාශ බවට පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

- 2020/03/13 වන දින මිලංක ගජනායක ඇතුළු මැර පිරිස විසින් රැගෙන විත් තිබූ ක්‍රිකට් පිත්ත තමාගේ යෝනි මාර්ගයට තියා තද කිරීමට මිලංක ගජනායක විසින් උත්සාහ දැරූ අවස්ථාවේදී ඊට ඔහුත් සමඟ පැමිණි අනෙක් තිදෙනාද සහාය ලබා දෙමින් තමාව සමූහ දූෂණයට ලක්කිරීමට උත්සහ දැරූ බවත් ඉන් තමා දැඩි වේදනාවකට, ලැජ්ජාවකට සහ දැඩි මානසික පීඩනයකට පත්වුණු බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර සිටියි. තමන් එම සිද්ධිය පිළිබඳව එම් අවස්ථාවේදී කාමරයට ඇතුල් වූ දෙවන වගඋත්තරකාර විතානගේ සහ හතරවන වගඋත්තරකාර ඒකනායක යන පොලිස් නිළධාරීන් දෙදෙනාට ප්‍රකාශ කල බවත් ඉන් පසු තමන්ව පොලිස් ස්ථානයට රැගෙන ගිය පසු පලමු වගඋත්තරකාර හේරත් මහතාටත් තුන්වන වගඋත්තරකාර සංජීවනී මහත්මියටත් තම ප්‍රකාශ සටහන් කරගත් පස්වන වගඋත්තරකාර අනුරාධා මහත්මියටත් නැවත නැවතත් පවසා සිටි නමුත් ඔවුන් කිසිවෙක් ඒ පිළිබඳව සැලකිල්ලක් නොදැක්වූ බව පැමිණිලිකාරිය තවදුරටත් ප්‍රකාශ කර සිටියි.

- තමන් අත්අඩංගුවට පත්ව රඳවා තබාගෙන සිටි කාල සීමාව තුළ, නීති විරෝධීව හැසිරුණු මිලංක ගජනායක ඇතුළු පිරිස නිදහස් කිරීම හේතුවෙන් ඔවුන් තමා සතුව තිබූ නිවසට ඇතුළුව තම පෞද්ගලික බඩුබාහිරාදිය හා තම නිවස බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමක් සිදු කිරීම හේතුකොට ගෙන තම ආදායම් මාර්ග සියල්ල කඩා වැටීමට ලක්වුණු බව පැමිණිලිකාරිය සිය ප්‍රකාශය තුල දක්වයි.

- ඉපලෝගම පොලිස් නිලධාරීන් විසින් නීති විරෝධී ලෙස තමාව අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම මිලංක ගජනායක යන පුද්ගලයා විසින් පොලිසිය තුළදී ඔවුන්ගේ ජංගම දුරකථන වලින් වීඩියෝ ගතකර සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ ප්‍රචාරය කිරීම හේතුවෙන් තමා හට සමාජයට මුහුණ දීමට නොහැකිව සමාජයෙන් වසන් වී සැඟවී සිටීමට සිදු වූ බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

- තමා විසින් මහර මහේස්ත්‍රාත් අධිකරණයේ 1566/22 යන නඩත්තු නඩුකරය ගොනුකරමින් නඩත්තු මුදලක් හා දික්කසාද නඩුවේ 614 වගන්තිය යටතේ තාවකාලික දික්කසාද දීමනාවක්ද ඉල්ලා සිටි අතර මිලන්ක ගජනායක යන අය විසින් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධාන හේතුව ලෙස දක්වන්නේ, පැමිණිලිකාරිය අනාචාරයේ හැසිරෙන කෙනෙක් නිසා එම දීමනාව ලබාදිය නොහැකි බවයි.ඒ බව සනාථ කිරීමට ඔහු විසින් යොදා ගනු ලබන එකම සාධකය වන්නේ ඉපලෝගම පොලිසියේ පොලිස් නිලධාරීන් විසින් සටහන් කළ වගඋත්තරකාර ප්‍රකාශයේ පිටපත් වන අතර ඒ මඟින්ද තමා හට විශාල අගතියක් සිදුවී ඇති බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

- 2020.03.14 දින සවස 4.00 පමණ ඉපලෝගම සිට පැමිණිලිකාරිය නැවත කොළඹ ඒමට තමන් පිටත් වූ බවත් අතර මග පිහිටි කැකිරාව හා දඹුල්ල පොලිස් ස්ථානයන්ට මේ සම්බන්ධව පැමිණිලි කිරීමට තමන් ගිය බවත් එම පොලිස් ස්ථානයන්ගෙන් පොලිසියකට විරුද්ධව තවත් පොලිසියකට පැමිණිල්ලක් භාර ගැනීමට නොහැකි බැවින් සුදුසුම දේ අනුරාධපුර නියෝජ්‍ය පොලිස්පතිතුමාට පැමිණිලි කිරීම බවට තමාට ඔවුන් උපදෙස් දුන් බවත් පැමිණිලිකාරිය පවසා සිටියි.

- 2020/03/15 වන දින කඳාන නිවසට තමන් පැමිණි බවත් ඒ වනවිට තමන්ගේ නිවස ස්වාමිපුරුෂයා විසින් බලහත්කාරයෙන් අයිතිකර ගැනීම හේතුවෙන් තමාට සිදුවූ අනර්ථය සම්බන්ධව කඳාන පොලිස් ස්ථානයේ පැමිණිලි කළ බවත්, මේ අතර 2023/03/19, කොවිඩ් 19 හේතුවෙන් සංචරණ සීමා පැනවූ බවත් මෙම සිදුවීම් සහ රටේ පැවති තත්ත්වය හේතු කොට ගෙන තමන් හට ඉපලෝගමදී සිදුවූ සිදුවීම සම්බන්ධව ඉහළ බලධාරීන් දැනුවත් කිරීමට අවස්ථාවක් නොලැබුණු බවත් පවසා සිටී.

- 2020/05/24 හෝ ආසන්න දිනක රටේ සංචරණ සීමා අර්ධ වශයෙන් ඉවත් කළ බවත්, කොවිඩ් පනත ප්‍රකාරව යම්කිසි අපරාධ නඩු කටයුතු සම්බන්ධව කිසිදු අගතිදායි තීන්දුවක් නොගන්නා ලෙසට බවට තමන් දැන සිටි බැවින් ප්‍රශ්නගත සිදුවීම සම්බන්ධව නෛතික පියවර ගැනීමට කාලය බාධාවක් නොවන බවට තමා විශ්වාස කළ බවත් පවසා සිටියි. හැඳුනුම්පතේ අංකයට අනුව තමන්ට එළියට යැමට හැකි දින සීමා සහිත වූ බැවින්, 2020/06/07 දින පොලිස්පතිතුමා, මහජන ආරක්ෂක ලේකම්තුමාට ,පොලිස් කොමිෂන් සභාවට, අනුරාධපුර ජ්‍යෙෂ්ඨ පොලිස්පති තුමන් යනාදී ම පුද්ගලයින්ට තමාට මුහුණ දීමට සිදුවූ යේ අනර්ථකාරී සිදුවීම පිළිබඳ ලිපි මඟින් දැනුම් දුන් බවත් පැමිණිලිකාරිය පවසා සිටියි.

- තමන් යොමු කරන ලද සියලු පැමිණිලි උතුරු මැද පළාත් භාර ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාටත්, උතුරු මැද පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිතුමාටත් සිද්ධිය සම්බන්ධව වැඩිදුර විමර්ශනය සඳහා යොමු කළ තිබූ බවට පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටී. ඒ අනුව පොලිස් අධිකාරි 01, ගොඩ කුඹුරු මහතාගේ ඍජු අධීක්ෂණය යටතේ අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ එවකට සිටි ස්ථානාධිපති B.S චන්ද්‍රසිරි මහතා විසින් විමර්ශන ආරම්භ කළ බවත්, ඒ අනුව 2020/07/09 දින මා කැඳවා මගේ පැමිණිල්ලට අදාලව යළිත් සම්පූර්ණ සිද්ධිය පිළිබඳව ප්‍රකාශයක් ලබා ගත් බවත් 2020.07.12 දින තමන්ව අධිකරණ වෛද්‍ය නිලධාරි තුමා වෙත යොමු කළ බවත් අනතුරුව විමර්ශන ආරම්භ කරමින් ඉපලෝගම රන්දියත හෝටලයට ගොස් ස්ථානය පරීක්ෂාවක් සිදුකළ තිබූ බවත් පවසා සිටියි.

- 2020/07/17 දින, B 1059 නඩු අංක යටතේ මිලංක ගජනායක ඇතුළු පිරිස මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර තිබූ බවත් පවසා සිටියි.B 1059 දරන බී අංකය යටතේ කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති ගොනුව වැඩිදුර විමර්ශනය සඳහා විමර්ශන නිලධාරි දිසානායක නැමැත්තෙකු වෙත යොමු කළ තිබූ නමුත්, චෝදනා ගොනු කිරීම හා විමර්ශන වාර්තාව, සාක්ෂිකරුවන් නම් කිරීම ආදිය අසම්පූර්ණව සිදුවූ බැවින් නීතිඥවරයෙකු මාර්ගයෙන් තමන් අධිකරණයට කරුණු ඉදිරිපත් කළ බැවින් නැවතත් අනුරාධපුර සහකාර පොලිස් අධිකාරි වෙත ගරු

සඳහා ගොනුව යොමු කරන ලෙස පොලිසිය අධිකරණයෙන් ඉල්ලා සිටි බවත් ඒ අනුව මේ වනවිට ගොනුව නීතිපතිතුමාගේ උපදෙස් සඳහා යොමු කර ඇති බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

- 2020/9 මාසයේ දිනක යළිත් වරක් පොලිස් අධිකාරි 2 කොඩි සිංහ මහතා විසින් තමා කැඳවා ප්‍රකාශයක් ලබා ගැනීමෙන් අනතුරුව අනුරාධපුර නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ විශ්‍රාමලත් පොලිස් අධිකාරි පියසේන පෙරේරා මහතා විසින් ඉපලෝගම පොලිස් නිලධාරීන් වන විතානගේ මහතා සංජීවනී පෙරේරා මහත්මිය ඒකනායක යන නිලධාරීන් තිදෙනාට විරුද්ධව විනය පරීක්ෂණයක් ආරම්භ කරන ලද බව ප්‍රකාශ කර සිටියි. සැසිවාර පහළොවක් පමණ පැවැත්වූ යේ මෙම විනය පරීක්ෂණයේදී 2022/07/19 දින තමන් සාක්ෂි ලබාදුන් බව පැමිණිලිකාරිය තවදුරටත් ප්‍රකාශ කර සිටියි. මෙම විනය පරීක්ෂණය අවසන් වාර්තාව තුලින් විනිශ්චය සභාවේ සභාපති පියසේන පෙරේරා මහතා ඉපලෝගම පොලිස් නිලධාරීන්ට පක්ෂපාතීව කටයුතු කරමින් තමාට විශාල අගතියක් සිදු කරන ලද බවද පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියි.

<u>01 වගඋත්තරකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක. එච්. එම්. කේ. හේරත් මහතා විසින් ලිඛිත දේශන මඟින් ඉදිරිපත් කර සිටින කරුණු</u>

- 2020.03.14 දින වන විට තමන් ඉපලෝගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස රාජකාරි කළ බවත් පැමිණිලිකාර හිමාලි ඉඳුනිල් අරුණ ශාන්ති යන අයගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා වන මිලංක ගජනායක යන අය කැකිරාව එප්පාවල පාරේ රන්දියත හෝටලයේ ආරවුලක් ඇති බවට 2020.03.14 දින 119 පණිවිඩ ජාලය මගින් පැමිණිල්ලක් කර තිබූ අතර එම පැමිණිල්ල UTR 9524/04 යටතේ පැය 0045ට පමණ පොලිස් ස්ථානයට ලැබී තිබුණු බවත් ප්‍රකාශ කර සිටියි. මෙම 119 පණිවිඩය පොලිස් ස්ථානයට ලැබීමෙන් පසු 2020.03.13 දින පොලිස් ස්ථානයේ රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටි නිලධාරීන්ට මෙම 119 පණිවිඩය පොලිස් ස්ථානය මගින් දැනුම් දී ඇත. ඒ අනුව ක්‍රියාත්මක වෙමින් රාත්‍රී ජංගම සංචාර රාජකාරියේ යෙදී සිටි උ.පො.ප විතානගේ, පො. කො.79679 ඒකනායක, සි.ආ.බා.07958 කරුණාරත්න සමග පො.කො.රි 23569 යාපාරත්න පැදවූ අංක 32-5535 දරන ජීප් රථයෙන් රන්දියත හෝටලයට ගොස් ඇති අතර එහිදී අනාවරණය වී ඇත්තේ මෙම පැමිණිලිකාරිය අනියම් පුරුෂයෙකු සමඟ පැමිණ රන්දියත හෝටලයේ කාමරයක නැවතී සිටියදී ඇයගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා වන මිලංක ගජනායක තම මිතුරන් දෙදෙනකු සමග එම ස්ථානයට පැමිණ පරීක්ෂා කිරීමේදි බිරිඳ සමඟ සිටි අනියම් පුරුෂයා කාමරයේ ජනේලයේ වීදුරුවක් කඩාගෙන පිටව ගොස් ඇති බව හා මෙහිදී මිලංක ගජනායක හා හිමාලි ඉඳුනිල් වන සැමියා හා බිරිඳ අතර පවුල් ආරවුල් තත්ත්වයක් ඇතිව තිබූ බවය.

- එම අවස්ථාවේදී හිමාලි ඉඳුනිල් ඇයට ස්වාමිපුරුෂයා හෝ වෙනත් අයෙකු පහරදීමක් හෝ වෙනත් වරදක් සිදුකර ඇති බවට කිසිදු පැමිණිල්ලක් සිදුකර නැති බවද එම අවස්ථාවේ ඇයට මෙම හෝටලයේ පිටව යා යුතු බවට පැවසූ නමුත් එම පවුල් ආරවුල් තත්ත්වයේ බරපතළකම නිසා හෝටල් කාමරය තුළ ඇය තනිව නැවතී සිටීමෙන් හෝ තනිව ආපසු යාමේදී අනතුරක් සිදුවීමට ඉඩ ඇති බව උ.පො.ප විතානගේට හැඟී යාම හේතු කොටගෙන ඇගේ ආරක්ෂාව සඳහා පොලිස් ස්ථානය වෙත කැඳවාගෙන විත් උප සේවක නිලධාරියාට භාරදී ආරක්ෂක මාතාව භාරයේ තබා ඇති බව පවසයි. මෙහිදී මෙම තැනැත්තිය රන්දියත හෝටලයේ සිට පොලිස් ස්ථානයට පැමිණ ඇත්තේ ඇය පැමිණ සිටි WP PKF 9443 දරන වන අතර එම ජීප් රථය ඇය විසින්ම පදවාගෙන පැමිණ ඇත.පොලිස් ස්ථානයට පැමිණි පසු ඇය උප සේවක නිලධාරියා විසින් ආරක්ෂක ය මාතාව ලවා පරීක්ෂා කර බලවා ඇති අතර එම අවස්ථාවේ බාහිරින් පෙනීමට කිසිදු තුවාලයක් හෝ තිබී නැති අතර ඇයට පහරදීමක් සිදු කිරීමක් සම්බන්ධයෙන් හෝ ප්‍රතිකාර ලබා ගැනීමට රෝහලට යාමට අවශ්‍ය බවට දැනුම් දීමක් සිදු කර නොමැති බවට එදින රාත්‍රී රාජකාරි භාර නිලධාරියා වන උප.පො.ප විමලවීර යන නිලධාරියා විසින් පැවසූ බවට වග උත්තරකරු තවදුරටත් ප්‍රකාශ කර සිටියි.

2020.03.14 වන දින පොලිස් ස්ථානයේ රාජකාරි වාර්තා කිරීමෙන් අනතුරුව තමන් ආරක්ෂක මාතාව සමගින් හිමාලි ඉඳුනිල් මහත්මියව තමාගේ කාර්යාලයට කැඳවා කරුණු විමසීමේ දී ඇය කැකිරාව ප්‍රදේශයේ තරුණයකු සමග ඇතිවූ ප්‍රේම සම්බන්ධතාවක් මත මෙම හෝටලය කාමරයක් කුලියට ගෙන සිටි බවත් සිදුවූ පවුල් ආරවුල පිළිබඳවත් පැවසූ අතර පොළොන්නරුව ප්‍රදේශයේ ඇගේ ඥාතියෙකුට මේ සම්බන්ධව දුරකථනයෙන් දැනුම් දී ඔවුන් පැමිණි පසු නිවසට යන බව මා සමග පවසා සිටි බව වග උත්තරකරු පවසා සිටී. එම අවස්ථාවේදී තමා ඉදිරියට පැමිණෙන විට ඇයට බාහිරින් පෙනීමට කිසිදු තුවාලයක් නොතිබූ බවත් ඇගේ පැමිණිල්ලෙහි සඳහන් පරිදි කන ඉරි ලේ වැගිරූ බව ඇය සඳහන් කර ඇතත් එය සම්පූර්ණයෙන් සාවද්‍ය ප්‍රකාශයක් බවත් පවසා සිටියි. ඊට අමතරව ඇයට කිසිවෙකුත් පහර දීමක් සිදුකළ බවට ලිංගික අතවරයක් සිදුකළ බවට හෝ රන් භාණ්ඩ කොල්ලකෑමක් සිදුකළ බවට තමා හට ප්‍රකාශ නොකළ බවට පවසයි.

119 පණිවිඩයෙන් ලැබී තිබූ පැමිණිල්ල පවුල් ආරවුලක් සම්බන්ධව බැවින් තමාගේ උපදෙස් අනුව ඉපලෝගම පොලිස් ස්ථානයේ එවකට කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනිය වන කාන්තා උ.පො. ප සංජීවනී විසින් පැමිණිල්ල විභාග කොට දෙපාර්ශවය සමථයකට පත් නොවීම මත දිසා අධිකරණය නඩුවක් මගින් විසඳා ගැනීමට උපදෙස් ලබාදී පැමිණිල්ල අවසන් කර ඇත. එම අවස්ථාවේද මෙම කාන්තාව, ඇයට පහර දීමක් සම්බන්ධ වූ ලිංගික අතවරයක් සම්බන්ධව හෝ රන් භාණ්ඩ කොල්ලකෑමක් සම්බන්ධව පැමිණිල්ලක් කර නොමැති අතර වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය බවට දැනුම්දීමක් නොකල බවද වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියි.

- හිමාලි ඉඳුනිල් මහත්මිය පොලිස් ආරක්ෂාව යටතේ සිට මුදාහැරීමෙන් පසු පොලිස් ස්ථානයෙන් පිටව ගොස් දුරකථන ඇමතුම් ලබාගෙන පැය භාගයකට පමණ පසුව ඇයගේ වාහනයේ තිබූ රන් භාණ්ඩ ස්වාමිපුරුෂයා විසින් ඔහු සතුව ඇති අමතර යතුරෙන් වාහනය විවෘත කොට රැගෙන ගොස් ඇති බවට පැමිණිල්ලක් සිදුකර ඇතත් ඇය පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමේදී උ.පො.ප. නිලධාරියාට හෝ වෙනත් කිසිදු නිලධාරියෙකුට ඇය සතුව වටිනා දේපළ හෝ රන් භාණ්ඩ පිළිබඳ දැනුම් දීමක් කර නොමැති බවට වගඋත්තරකරු පවසයි.

- මෙකී පැමිණිල්ල විභාග කිරීම සඳහා පැමිණිලිකාරිය හා වග උත්තරකරු වන ස්වාමිපුරුෂයා පොලිස් ස්ථානයට කැඳවා ගැනීමට දුරකථන පණිවිඩ ඔවුන් පදිංචි පොලිස් වසම වන කඳාන පොලිස් ස්ථානයෙහි ස්ථානාධිපති විසින් දැනුම්දී තිබූ නමුත් දෙපාර්ශවයටම පැමිණිල්ල විභාග කිරීමට පැමිණ නොමැති තත්ත්වයක් යටතේ ඔවුන්ට පැමිණිල්ලේ උද්‍ධෘත පිටපත් පදිංචි කඳාන පොලිස් ස්ථානය වෙත ෆැක්ස් පණිවිඩයක් මගින් යොමු කර පැමිණිල්ල විභාග කිරීමට දැනුම් දෙන ලද බවත් පවසා සිටියි.

- මෙම සිදුවීමෙන් මාස තුනක කාලයක් ඇවෑමෙන් පසු හිමාලි ඉඳුනිල් නමැත්තිය ජනාධිපතිතුමා ආරක්ෂක ලේකම්තුමා පොලිස්පතිතුමා සහ උසස් නිලධාරීන් වෙත පෙත්සමක් යොමු කරමින් ව්‍යාජ කරුණු හා ව්‍යාජ ඡායාරූප ඇතුළත් කර ඇයට පහරදීමක් හා රන් භාණ්ඩ කොල්ලකෑමක් ලිංගික අතවරයක් සිදුවූ බවටත් පොලිසිය විසින් විමර්ශන හරියාකාරව සිදු නොකළ බවටත් අසත්‍ය කරුණු ඉදිරිපත් කරමින් අසත්‍ය චෝදනා ඉදිරිපත් කර ඇති බවට වග උත්තරකරු ප්‍රකාශ කර සිටියි.

- එවැනි අපරාධයන්ට ගොදුරු වීමක් සිදු වුණි නම් 2020.03.14 ඉපලෝගම පොලිස් ස්ථානයෙන් පිටවූ පසු එදිනම හෝ ආසන්න දිනයක මේ පිළිබඳ වෙනත් පොලිස් ස්ථානයකට පැමිණිලි කිරීමක් හෝ උසස් නිලධාරි මහතෙකුට පැමිණිලි කිරීමට අවකාශ තිබූ බවත් වෛද්‍ය ප්‍රතිකාර හා වෛද්‍ය වාර්තාවක් ලබා ගැනීමට පැමිණිලිකාරියට අවකාශ තිබූ බවත් වග උත්තරකරු ප්‍රකාශ කර සිටියි.

- රන්දියත හෝටලේ කාමරයක ඇය වෙනත් පුද්ගලයකු සමග සිට ස්වාමිපුරුෂයාට හසුවීම නිසා පුරුෂයා විසින් මෙම කාන්තාවගෙන් දික්කසාද වීමට නඩු පැවරීමට කටයුතු කරන බව පසුව දැනගෙන ඇයගේ නීතිඥ උපදෙස් මත මාස තුනකට ආසන්න කාලයකට පසු පැමිණිලිකාරිය සාවද්‍ය හා අසත්‍ය තොරතුරු ඇතුලත් කර පොලිස් නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි ගොනුකර ඇති බවත් දික්කසාද නඩුවකදී මෙම සිදුවීම අයටත් අවාසිදායක වන හෙයින් පොලිස් නිලධාරින් කෙරෙහි ඇතිවූ ද්වේෂ සහගත හැඟීම නිසා පොලිස් නිලධාරින් බියකට හා පීඩනයට පත් කිරීමේ අරමුණින් මෙම පැමිණිල්ල සිදුකර ඇති බව පවසා සිටී.

- මෙම සිදුවීමෙන් වසරකුත් මාස දහයකට පසු ශ්‍රී ලංකා මානව කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම, 2024.01.11 කොමසාරිස්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ පරීක්ෂණයේදී පැමිණිලිකාරියහ විසින් ඉදිරිපත් කරන ලද ලිපියේ පළමු ඉල්ලීම වනුයේ ස්වාමිපුරුෂයා විසින් ඇයට විරුද්ධව ගොනුකරන ලද නඩු වලදී යට අගතිදායක සාක්ෂි ලබා නොදීමට එකඟ විය යුතුය යන්න තුළිනුත් ඇගේ අසත්භාවී චේතනාව පැහැදිලි වන බව උත්තරකරු දක්වයි.

- පොලිසිය ඇය සමඟ සිටි පුරුෂයා සම්බන්ධව විමර්ශනයක් සිදුකර නැති අතර එය නීතිමය වරදක් නොවෙන හෙයින් ඒ පිළිබඳව ඉපලෝගම පොලිසිය විසින් කිසිදු පරීක්ෂණයක් නොපැවත්වූ බව තවදුරටත් සඳහන් කර සිටියි . තමන් ඇයට ඇයගේ පැමිණිල්ලේ පවසන පරිදි බැණ වැදීමක් සිදු නොකළ බවත් පොලිස් නිලධාරීන් ලෙස මහජන දේපළ හා ජීවිත ආරක්ෂා කිරීමේ කාර්ය පමණක් ඉටුකළ බවත් ගේ ස්වාමි පුරුෂයා මෙම සිද්ධිය මත ආවේගශීලීව හා ප්‍රකෝපකාරීව අයගේ ජීවිතයට හානියක් සිදු කිරීමට ඉඩ ඇති බව එම අවස්ථාවේ හැඟුණු බැවින් ම අවස්ථාවේ ඇති සුදුසුම ක්‍රියා මාර්ගය ලෙස ඇය පොලිසියට රැගෙනවිත් ආරක්ෂාව සඳහා තබා ගැනීම සිදුකළ බවත් පවසයි.

<u>02 වගඋත්තරකරු උ.පො.ප.ජේ.කේ. විතානගේ මහතා විසින් ලිඛිත දේශන මඟින් ඉදිරිපත් කර සිටින කරුණු</u>

- 2020/03/13 වන දින විට තමන් ඉපලෝගම පොලිස් ස්ථානයට අනුයුක්තව පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් සේවයේ නියුක්ත වූ බවත් එදින පො.කො 79679 ඒකනායක, සි.ආ.බා කරුණාරත්න සමඟ පො.කො.රි 23569 යාපාරත්න පැදවූ අංක 32-5535 දරන ජීප් රථයෙන් ජංගම මුර සංචාරයේ යෙදුණ බවත් පැය 00.50 ට පොලිසියෙන් ලැබුණු දුරකථන ඇමතුමකට අනුව මෙම සිදුවීමට අදාල රන්දියත හෝටලයට ගිය බවත් එහිදී පැමිණිලිකාරිය මිලංක ගජනායක නැමති ඇයගේ නීත්‍යානුකූල ස්වාමි පුරුෂයාට හොරෙන් අනියම් පුරුෂයෙකු සමඟ මෙම හෝටලයේ කාමරයක නවාතැන්ගෙන් සිටීම හේතුවෙන් මෙම ආරවුල සිදුවූ බවට තමන්ට අනාවරණය වූ බවට පවසා සිටියි.

මෙම ආරවුල් වන අවස්ථාව වන විට කාන්තාව පමණක් කාමරයේ රැඳී සිටි අතර අනියම් පුරුෂයා කාමරේ ජනේලයෙන් පලා ගොස් සිටි බවත් කාමරේ ජනෙල් දෙකක් කඩා තිබූ අතර එම සිදුවූ අලාභය හෝටල් කළමනාකරු වෙත මිලංක ගජනායක විසින් ගෙවා තිබීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග නොගන්නා ලෙස හෝටල් කළමනාකරු වන දිනේෂ් නිරෝෂන් යන තමාගෙන් ඉල්ලා සිටින ලද බවත් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියි.

මේ අවස්ථාව වන විට වේලාව අලුයම දෙක පමණ වී තිබූ බවත් මෙම සිදුවීම සම්බන්ධයෙන් තමාගේ ජංගම දුරකථනයෙන් පොලිස් ස්ථානාධිපති දැනුවත් කළ බවත්, එතුමාගේ උපදෙස් පරිදි ගැටළුවට පත්ව සිටි පැමිණිලිකාරිය පමණක් හෝටල් කාමරයේ රැඳී සිටි බැවින් ඇගේ ආරක්ෂාව සඳහා පසුදින උදෑසන වන තෙක් ඇයව පොලිසියේ තැබීමට තමන් විසින් කටයුතු කළ බවත් ආරක්ෂක මාතාව භාරයේ ඇය නිසි

ආරක්ෂාව යටතේ තැබූ බවත් මෙදින රාත්‍රී රාජකාරී භාර නිලධාරියා වන උ.පො.ප විමලවීර මේ පිළිබඳව දැනුවත් කළ බවත් ප්‍රකාශ කර සිටියි .

මේ සම්බන්ධයෙන් තමා විසින් සිදුකර ඇත්තේ පොලිස් ස්ථානයෙන් ලද තොරතුරුකට අනුව ආරවුලට පත්ව සිටි වින්දිත කාන්තාව ඇගේ ආරක්ෂාවත් සඳහා පොලිස්ථානයට ඉදිරිපත් කිරීම පමණක් වන බවත් විමර්ශන කටයුතු ස්ථානාධිපතිතුමන්ගේ අධීක්ෂණය යටතේ උප පොලිස් පරීක්ෂක සංජීවනී විසින් සිදුකර ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කර සිටියි.

<u>03 වගඋත්තරකරු උ.පො.ප. සංජීවනී මහත්මිය විසින් ලිඛිත දේශන මඟින් ඉදිරිපත් කර සිටින කරුණු</u>

තමා ඉපලෝගම පොලිස් ස්ථානයට අනුයුක්තව ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති වශයෙන් රාජකාරිය කරමින් සිටියදී 2020.03.13 වන දින 119 හදිසි ඇමතුම් සේවාව වෙත ලද පණිවිඩයකට අනුව පෙත්සම්කාරිය හා ඇයගේ පුරුෂයා වන මිලංක ගජනායක අතර ඇති වූ පවුල් ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශවයට සිවිල් අධිකරණ නඩුවක් පවරා ගන්නා ලෙසට තමන් උපදෙස් ලබාදීම දෙපාර්ශවයේම ඉල්ලීම හා කැමැත්ත මත සමථ සටහන් යෙදීම සිදු කරන ලද බවට මෙම වගඋත්තරකාරිය ප්‍රකාශ කර සිටියි.

මෙම හිමාලි ඉඳුනිල් නැමති පෙත්සම්කාරිය විසින් 2020.03.14 දින රන් භාණ්ඩ ආරවුලක් සම්බන්ධයෙන් තම ස්වාමිපුරුෂයාට විරුද්ධව සිදුකරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් තමන් කිසිදු විමර්ශනයක් සිදු නොකළ බවත් 2020.03.15 දින ස්ථාන මාරුවීම් ලබා බදුල්ල කොට්ඨාශයට තමන් රාජකාරි බාර ගත් බවත් වගඋත්තරකාරිය පවසා සිටියි.

තවදුරටත් තමා විසින් පෙත්සමේ සඳහන් පරිදි පෙත්සම්කාර තැනැත්තිය කිසිම අවස්ථාවක දී අත්අඩංගුවට ගැනීමක් හෝ ඒ සඳහා සහාය වීමක් සිදුකර නොමැති බවත් ඇගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදුකළ නොමැති බවත් පෙත්සම්කාරිය තමා වෙත දෝෂ සහගත අසත්‍ය චෝදනාවක් එල්ල කර ඇති බවත් තමන් එකී චෝදනාවන් ප්‍රතික්ෂේප කරන බවත් තෙවන වගඋත්තරකාරිය ප්‍රකාශ කර සිටියි.

<u>04 වගඋත්තරකරු පො.කො.79672 ඒකනායක මහතා විසින් ලිඛිත දේශන මඟින් ඉදිරිපත් කර සිටින කරුණු</u>

තමන් 2020/03/13 දින රාත්‍රී ජංගම සංචාර රාජකාරියේ යෙදී සිටියදී මෙම සිදුවීම සම්බන්ධයෙන් එම කණ්ඩායම් බාර උ.පො.ප විතානගේ මහතාහට සහායක නිලධාරියෙකු ලෙස කටයුතු කිරීම පමණක් කළ බවත් ඒ අනුව පැමිණිලිකාරියගේ පුරුෂයා සමඟ පැමිණි පුද්ගලයින් තිදෙනකුගේ ප්‍රකාශ එම රන්දියත හෝටලය තුළදී ලබා ගැනීම පමණක් තමා විසින් සිදු කළ බවත් සිව්වන වග උත්තරකරු ප්‍රකාශ කර සිටියි.5 වගඋත්තරකරු වන ක.පො.කො.අනුරාධා මහත්මිය හා 6 වන වගඋත්තරකරු වන සිවිල් ආරක්ෂක කරුණාරත්න මහතා විසින් කිසිදු කරුණු දැක්වීමක් ඉදිරිපත් කර නොමැත.

<u>නිරීක්ෂණය</u>

- 119 දුරකථන අංකයට 2020/03/14 වන දින 00.45 මිලංක ගජනායක ලබාදුන් ඇමතුම අනුව ඔහු දැනට රන්දියත හෝටලය ඉදිරිපිට රැඳී සිටින බවත් තම බිරිඳ වෙනත් පුද්ගලයකු සමග හෝටලේ රැඳී සිටින බව දන්වා සිටි බවතට පොලිස් වාර්තා වල උදෘත අනුව නිරීක්ෂණය වේ. කාන්තාවකගේ අනාචාරය හැසිරීමක් සම්බන්ධයෙන් ලැබුණු මෙම පැමිණිල්ල සඳහා කාන්තා පොලිස් නිලධාරිනියක්

යෙදවිය යුතු බවට පොලිස් නිලධාරීන් එහි පැමිණීමට පූර්වයෙන් දැන සිටියත් එම ස්ථානය පරීක්ෂාවට කාන්තා නිලධාරිනියක් යොදාගෙන නොමැති බව නිරීක්ෂණය වේ. එසේම අනාචාරය අපරාධමය වරදක් නොවන බව පොලිස් නිලධාරීන් දැනුම්වත්ව ඇත.තැනැත්තන් කීපදෙනෙක් හෝටලයට බලෙන් ඇතුල්ව හානිකරන බව රන්දියත හෝටලයේ කලමණාකරු විසින් 119 අංකයට කථාකර දැන්වූව බව, එකී කළමනාකරු විසින් එම සිද්ධිය පිලිබඳව පසුව විශේෂ පරීක්ෂණයක් කල පොලිස් කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යංශයේ නිළධාරීන්ට ප්‍රකාශ කොට ඇත.එහෙත් ඉපලෝගම පොලිසිය විසින් ඒ පිලිබඳ කිසිඳු සඳහනක් කර නොමැති වීම මගින් හෝටලය තුළ ඇතිවූ සිද්ධියට වගකිව යුතු සැකකරුවන් ආරක්ෂා කිරීමට ගත් උත්සාහයක්ද යන ගැටළුව මතුවේ.

➢ 119 පැමිණිල්ල විමර්ශනයට රන්දියත හෝටලයට ගොස් අදාල ස්ථානයේ ස්ථානීය පරීක්ෂාවේ යෙදුණු උ.පො.ප විතානගේ විසින් සිදුකල ප්‍රකාශය අඩංගු බී වාර්තාවේ, ඔහු හෝටලේ අංක 201 කාමරය වෙත ගොස් බලන විට එම කාමරයේ කාන්තාවක් සිටි බවත් රතු පැහැති ඇඳ ඇතිරිල්ලක් ඇඳ සිටි බවත් පවසා ඇත. සාක්ෂිකරුවන්ගේ පොලිස් නිලධාරීන්ගේ ප්‍රකාශ වලින් පැහැදිලි වන පරිදි අපරාධමය පරිසරයක් එම ස්ථානය තුළ පැවතිය දී එම ස්ථානය අපරාධ ස්ථානයක් සේ සලකා කටයුතු කර චූදිතයින් අත්අඩංගුවට ගැනීම වෙනුවට වින්දිතයාව අත්අඩංගුවට ගැනීමක් පොලිස් නිලධාරීන් විසින් සිදුකොට ඇත. ඒඅනුව පොලිස් නිලධාරීන් විසින් නීතියෙන් බැහැරව කටයුතු කරඇති බව නිරීක්ෂණය වේ. <u>ලන්දගේ ඉෂාරා අංජලී එදිරිව බරණී බෝගහවත්ත</u> නඩු තීන්දුව තුළ වින්දිතයා සිරකුටියක රඳවා තබා ගන්නවා තබා අත්අඩංගුවට ගැනීමටවත් කිසිදු අවස්ථාව වග උත්තරකාරියට අවසරයක් නොමැති බව දක්වා ඇත. එසේම එම නඩු තීන්දුවේ පොලිස් නිලධාරීන් තරයේ අනුගමනය කළ යුතු යැයි අධිකරණය විසින් දක්වා ඇති දක්වා ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව කාන්තාවන් සම්බන්ධ විශේෂ තත්වයන් කෙරෙහි නීති බලධාරීන් අවධානය යොමු කළ යුතු බවත් අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව නීති විරෝධී හෝ වෙනස් කොට සැලකීමක් නොකළ යුතු බව සඳහන් කරයි. [ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) සඳහන් වන අත්තනෝමතිකව අප අඩංගුවට ගැනීමෙන් රඳවා තබා ගැනීමෙන් වැළකී සිටීමේ අයිතිය පැමිණිලිකාරිය සම්බන්ධයෙන් වගඋත්තර කාර 1,2,3,4, 5 පාර්ශවයන් විසින් උල්ලංඝනය කොට ඇත.]

➢ 2020.07.15 දින දෙවන වරට මෙම සිදුවීම් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු පැවැත්වූ අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් රන්දියත හෝටලයේ ස්ථාන පරීක්ෂාව සිදු කරන අවස්ථාවේදී එම කළමනාකරු විසින් බරපතල ලිංගික අපයෝජනයට යොදා ගනු ලැබූ බවට කියැවෙන ක්‍රිකට් පිත්ත පොලිසියට ඉදිරිපත් කිරීමෙන් පසුව අධිකරණයට නඩු භාණ්ඩයක් වශයෙන් ඉදිරිපත් කර ඇත. මෙම පරිවේෂණීය සාක්ෂි නියමිත ආකාරයට නිසි ලෙස ඉපලෝගම පොලිසිය විසින් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබුවේ නම් සමූහ දූෂණයට අදාළ දිනයේදී ඊට අදාළ කරුණු විද්‍යාත්මකව තහවුරු කරගැනීමට අවකාශ තිබූ නමුත් වගඋත්තරකාර 2,4 නිලධාරීන්ගේ ක්‍රියා කලාපය හේතුවෙන් එම අපරාධමය විමර්ශනයට අදාළ කරුණු යටපත් වී ඇත . එසේම අපරාධ ස්ථානය පිලිබඳව කිසිදු කටු සටහනක් පිලියෙල කිරීමද එම ස්ථානයට පැමිණි ඉපලෝගම පොලිස් නිලධාරීන් සිදුකර නැත.

➢ මෙකී සමස්ත සිදුවීම සම්බන්ධයෙන් අනුරාධපුර කොට්ඨාස අපරාධ අංශයේ ස්ථානාධිපති විසින්, B 1059/2020 අංකය යටතේ මහේස්ත්‍රාත්තුමන්ට ඉදිරිපත් කළ බී වාර්තාවේ ඉපලෝගම රන්දියත හෝටලයේ සිද්ධිය වූ අවස්ථාවේදී සේවය කරන ලද කළමනාකරු වන කමේෂ් නිරෝෂන් ගජනායක හා හෝටල් සේවකයකු වන මහින්ද ප්‍රේමලාල් ඒකනායකගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇත.මෙම සාක්ෂිකරුවන් කිසිදු අවස්ථාවක කාමරය තුළ වෙනත් පුරුෂයෙකු සිටි බව හෝ කාන්තාව වෙනත් පුරුෂයකු සමඟ හෝටල් කාමරයට ඇතුළු වීමක් සිදුකරනු හෝ දැක නොමැති බව මෙකී සාක්ෂි මගින් පැහැදිලි වේ. එහෙත් 119 ඇමතුම සම්බන්ධයෙන් විමර්ශනයට සහභාගී වූ වගඋත්තරකාර 2 හා 4

පොලිස් නිලධාරීන් ඉතා වැදගත් සාක්ෂිකරුවකු වූ මිලංක ඇතුළු පිරිසගෙන් පහර කෑමට ලක්වූ රන්දියත හෝටලයේ සේවකයකු වූ මහින්ද ප්‍රේමලාල් ඒකනායකගෙන් ප්‍රකාශ සටහන් කරගෙන නොමැති බව නිරීක්ෂණය වේ. හෝටල් කළමනාකාර කමේෂ් නිරෝෂන් මහතා ඉපලෝගම පොලිසියට ලබා දුන් ප්‍රකාශයට අනුව හෝටල් කාමරයෙහි අනාචාරි පුද්ගලයෙකු සිටිනු තමා දුටු බවට සඳහන් කර සිටියද එය කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යංශයේ නිළධාරීන්ට ලබාදී ඇති සාක්ෂි ප්‍රකාශය හා සංසංදනය කිරීමේදී පරස්පර විරෝධි බව නිරීක්ෂණය වේ.

- පැමිණිල්ල ලැබී ඇත්තේ අනාචාරයක් සම්බන්ධයෙන් නමුත් අනාචාරය යන්න අපරාධමය වරදක් නොවන වෛවාහක සහනයක් ලබා ගතහැකි සිවිල් වරදක්ය යන්න මෙම සිදුවීම සම්බන්ධ නෛතික තත්වය බවට නිරීක්ෂණය වේ. පොලිස් නිලධාරීන්ට මෙම ආරවුලේ පැවති අපරාධමය ස්වභාවය එනම් දණ්ඩ නීති සංග්‍රහයේ **443,382,490** සමග කියවෙන **364,365** හා **314** යන වගන්ති යටතේ මිලංක ගජනායක ඇතුළු පිරිසට චෝදනා ගොනු කළ හැකිව තිබූ බවත් ඔවුන් අත් අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් කරුණු තිබූ බවත් යන්න පවුල් ආරවුල යන සිවිල් කාරණය කෙරෙහි අවධානය යොමු කිරීම හේතු කොටගෙන මඟහැරී ඇති බව හෝ සිතාමතා මඟහැර ඇති බව නිරීක්ෂණය වේ.

මේ බව තවදුරටත් සනාථ වන්නේ අනුරාධපුර කොට්ඨාස අපරාධ කාර්යාංශය මගින් මෙම සිදුවීම සම්බන්ධයෙන් අවසාන විමර්ශන නිලධාරියා වශයෙන් කටයුතු කරන පොලිස් නිලධාරියා විසින් **2024.06.23** දිනැතිව නීතිපති උපදෙස් සඳහා යොමු කරනු ලබන ලිපියෙහි සඳහන් කර ඇත්තේ තමන් විසින් සිදුකළ වැඩිදුර විමර්ශනය තුළින් පැමිණිකාරිය විසින් ඉදිරිපත් කර ඇති කරුණුවල සත්‍යතාවයක් ඇති බව නිරීක්ෂණය වන බවත් ඉපලෝගම පොලිස් ස්ථානයේ නිලධාරීන් උත්සහ කර ඇත්තේ අනියම් පුරුෂයෙකු සමග සිට විවාහක කාන්තාවකට තම පුරුෂයා විසින් සිදුකළ පවුල් ආරවුලක් බවට මෙම සිදුවීම ඇඟවීමට බවත්ය. එහෙත් සාක්ෂි හා කරුණු අනුව නිරීක්ෂණය වන්නේ වෙනත් තැනැත්තෙක් ඇය අදාළ ස්ථානයට ඇරලවා ගිය බව හැර, ඇය හා කාමරයේ කිසිම තැනැත්තෙකු නොසිටි බවයි.රන්දියත හෝටලයේ කළමනාකරු හා අදාළ සේවක මහතා විසින් හෝ පොලිසිය විසින් හෝ එවැනි තැනැත්තෙකු කාමරය තුළ සිටි බව ප්‍රකාශ කර නොමැති වීමෙන් එය පැහැදිලි වේ.

- වගඋත්තරකාර **1,2,3,4,5** යන පොලිස් නිලධාරීන් පැමිණිලිකාරිය සම්බන්ධයෙන් තහවුරු නොවූ අනාචාරය පිළිබඳ සිවිල් සිදුවීමක් සම්බන්ධයෙන් තබන ලද සටහන් හා සිදු කරනු ලබන ප්‍රකාශ සහ වින්දිතයා අත්අඩංගුවට ගැනීම තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **13(5)** දැක්වෙන නිර්දෝෂී බවේ පූර්ව නිගමනය පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝනය කොට ඇති බවද නිරීක්ෂණය වේ

- තවදුරටත් අපරාධ නඩු විධාන සංග්‍රහයේ **109 (5)** වගන්ති ප්‍රකාරව වරදක් සම්බන්ධව විමර්ශනය කිරීමේදි අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය දක්වා ඇත. ඒ අනුව එවැනි සැකයක් ඇතිකර ගැනීමට හේතු තිබේ නම් පොලිස් නිලධාරියා විසින් ඒ වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙතද, පොලිස් ස්ථාන භාර යම් නිලධාරියෙකු සම්බන්ධ වන විට ඔහුගේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියාටද ඒ පිළිබඳ වාර්තාවක් වහාම යැවිය යුතු බවත් හා සිද්ධි හා අවස්ථාගත කරුණු විමර්ශනය කිරීමටද වරදකරු සොයා සිරභාරයට ගැනීම සඳහා අවශ්‍ය යම් පියවර ගැනීමටද ඒ ස්ථානයට ඔහු පෞද්ගලිකව යා යුතු බවත් සඳහන් කර ඇත. වගඋත්තරකාර **01,02** නිලධාරීන් මෙම සිදුවීමට අදාළ සිද්ධිමය කරුණු සළකන විට අ.න.වි.ස **109(5)** කාර්ය පටිපාටිය අනුව නිසිලෙස පැමිණිලිකාරිය සම්බන්ධයෙන් කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය වේ.

- පොලිස්පති චක්‍රලේඛ **2328/2012** අපරාධ චක්‍රලේඛ **22/2011** ,**2** වගන්ති ප්‍රකාරව සිරභාරයට ගෙන ඇති තැනැත්තන්ගේ තුවාල ආදිය තිබේ නම් ඔහු අධිකරණ වෛද්‍ය නිලධාරියෙකුට ඉදිරිපත් කර වාර්තාවක් ලබා ගත යුතුය යනුවෙන් දක්වා ඇත. එසේම පොලිස් දෙපාර්තමේන්තු නියෝග **A-20, 4**

වගන්තිය තුළ සිරභාරයට ගත් තැනැත්තාට තුවාල තිබේ නම් ඒ පිළිබඳ සටහන් කළ යුතු බවත් සිරකරුට අවශ්‍ය නම් කාරණයට ගැලපෙන පරිදි වෛද්‍ය නිලධාරියකු ලබා ගැනීමට හෝ ඔහුගේ ප්‍රකාශ සටහන් කිරීමට හෝ වහාම කටයුතු පිළියෙල කළ යුතු බවට සඳහන් වේ. පැමිණිලිකාරිය තමා සමූහ දූෂණයට පත් කිරීමට උත්සහ කළ බව තමා හට සිදු වූ ලිංගික හිරිහැරයන් පිළිබඳව සහ වෛද්‍ය ප්‍රතිකාර වල අවශ්‍යතාවය සම්බන්ධයෙන් දිගින් දිගටම වගඋත්තරකාර 1,2,3 නිලධාරීන්ට ප්‍රකාශ කර සිටි බවට ඇගේ දිවුරුම් ප්‍රකාශ මගින් ප්‍රකාශ කර ඇති නමුත් වගඋත්තරකරුවන් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය වේ. සැකකරුවෙක් වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය බවට පැවසූ විට වෛද්‍යවරයෙකු වෙත යොමු කළ යුතුය යනුවෙන් දෙපාර්තමේන්තු නියෝග A-20 පැහැදිලිව සඳහන් කර තිබියදීත්, පොලිස් නිලධාරීන් ඒ සම්බන්ධව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකාරියගේ දිවුරුම් ප්‍රකාශ වලට අනුව විසින් වෛද්‍ය ප්‍රතිකාර දිගින් දිගටම ඉල්ලා සිටියත් ඒ සම්බන්ධව පොලිස් නිලධාරීන් ක්‍රියාත්මක වීමක් සිදු නොකර ඇති බව ප්‍රකාශ කර ඇති අතර වගඋත්තරකරුවන් විසින් පවසන පරිදි පැමිණිලිකාරිය විසින් එවැනි ඉල්ලීමක් නොකළද මෙම සිද්ධියේ කරුණු අනුව ඇය වෛද්‍යවරයකු වෙත යොමු කිරීම පොලිසියේ වගකීමක්ව පැවති බවද පෙනීයයි.කිසිදු තුවාලයක් එම අවස්ථාවේ පැමිණිලිකාරියගේ ශරීරයේ නොතිබූ බව වගඋත්තරකරුවන් විසින් කරන ප්‍රකාශයේ විශ්වාසනීයත්වය සම්බන්ධ ගැටලුකාරී තත්ත්වයක් පවතී. මක්නිසාදයත් 2020.07.15 දින මෙම සිදුවීමෙන් මාස හතරකට ආසන්න කාලයක් පසු ලබාගත් අධිකරණ වෛද්‍ය සහතිකයේ පවා scar of laceration එනම් තුවාලයක කැලැල් පිළිබඳව වෛද්‍යවරයා සඳහන් කොට ඇති බැවිනි.

- 01 වන වගඋත්තරකරු විසින් ඥාතියකු පැමිණි තුරු පොලිස් ස්ථානයේ පැමිනිලිකාරිය රැඳිසිටි බවට ප්‍රකාශ කළ නමුත් දුරකථන ද්විත්වයම පොලිසියේ භාරයේ පැවතියදී ඇයට කුමන හෝ පුද්ගලයකුට කතා කිරීමට හැකියාවක් නොපැවති බවද නිරීක්ෂණය වේ. එසේම 2020/03/14 දින 11.00 ට, මෙම පැමිණිලිකාරියට ඇප ලබා දීමට කිසිවෙකු නොපැමිණීම මත පො.සැ 47966 ඉලංගසිංහ විසින් ලබා දුන් පුද්ගලික ඇපයක් මත ඇයව නිදහස් කර ඇති බව පොලිසියේ ලේඛන මඟින් තහවුරු වේ.එබැවින් පැමිණිලිකාරිය අත්තඩංගුවට ගෙන ඇති බවද රඳවාගෙන ඇති බවද තහවුරුවේ.

- 01 වගඋත්තරකරු ඥාතියකු පැමිණෙන තුරු පොලිස් ස්ථානයේ පැමිණිලිකාරිය රැඳිසිටි බවට ප්‍රකාශ කළ නමුත්, එසේම 01 වගඋත්තරකරු විසින් මෙම අත්අඩංගුවට ගැනීම පැමිණිලිකාරියගේ ආරක්ෂාව පතා සද්භාවයෙන් සිදු කරන ලද රඳවා ගැනීමක් යනුවෙන් සඳහන් කළද පැමිණිකාරියගේ වාහනේ යතුර වාහන බලපත්‍ර ඇතුළු භාණ්ඩ පොලිසිය භාරයේ තබා ගැනීමෙන් හුදු ආරක්ෂාව සඳහා නොව කැමැත්තකින් තොරව පොලිසිය භාරයේ ඇය රඳවා තබා ගැනීමක් සිදුව ඇති බවද නිරීක්ෂණය වේ. 01 වගඋත්තරකරු පැමිණිලිකාරියෙහි ඇගේ වාහනය ඇය විසින්ම පදවාගෙන පොලිස් ස්ථානයට රැගෙන ආ බවක් සිය ලිඛිත දේශනයෙහි ප්‍රකාශ කර සිටි. ඇය ගේ වාහනයෙන්ම පොලිස් ස්ථානයට රැගෙන යාම තුළ පවා අත්අඩංගුවට ගැනීමක් පැහැදිලිවම පවතින බව <u>පියසිරි සහ තවත් අය එදිරි නිමල් ප්‍රනාන්දු සහ තවත් අය</u> [1988 1 Sri LR 173/1988 1 Sri LR 173] යන නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දක්වා ඇති තීරණය අනුව පැහැදිලි වේ. එනම්,

"අද වන විට සිරභාරය යන්න, සෑම විටම සිරකර තැබීම යන අදහස අත්‍යවශ්‍යයෙන්ම ප්‍රකාශය නොකරන අතර රඳවා තබා ගැනීම මගින් එහාමෙහා යාමේ නිදහස සීමා කිරීම පමණක් ම නොව අවස්ථාපිත කරුණු අනුව තීරණය කළ හැකි තර්ජනාත්මක බල කිරීමක් දක්වා පැතිර ගොස් ඇති බවට" දක්වන ශ්‍රේෂ්ඨාධිකරණ මතයෙන් පැහැදිලි කර ඇත. මේ අනුව ඇගේ කැමැත්තෙන් තොරව පැය 18කට ආසන්න කාලයක් රඳවා ගැනීමත් ඇප ලබාදී නිදහස් කිරීමත් යන සමස්ත ක්‍රියාවලිය තුළ අත්අඩංගුවට ගැනීමක් පැහැදිලිවම දැක ගත හැක.

- පැමිණිලිකාර සිය දිවුරුම් ප්‍රකාශයන්හි දක්වන පරිදි ඇයව අත්අඩංගුවට පත්වන අවස්ථාවත් පසුව පොලිස් ස්ථානයේ ඇය රඳවා තබාගෙන සිටි අවස්ථාවත් මිලංක ගජනායක ඇතුළු පිරිස වීඩියෝ ගතකර සමාජ මාධ්‍ය ගිණුම්වලට මුදා හැර ඇති බවත් තමන් ඉපලොගම පොලිස් ස්ථානය තුළ අත්අඩංගුවෙහි පසු වූ කාලසීමාව තුළ චූදිතයින් පොලිස් ස්ථානය තුළ නිදැල්ලේ සැරිසරමින් මෙම වීඩියෝ ගත කිරීම සිදුකළ බවත් පවසා සිටියි.

ලන්දගේ ඉෂාරා අංජලී එදිරිව වරුණි බෝගහවත්ත (SC/FR/677/2012) තීන්දුව තුළ අධිකරණය විමර්ශන නිලධාරීන් සම්බන්ධව ඉදිරිපත් කරන මාර්ගෝපදේශ වලට අනුව කාන්තාවන් සහ දරුවන්ට එරෙහිව නිවසේදී ,සමාජයේදී හෝ නිල ආයතනවලදී රාජ්‍ය නිලධාරීන් හෝ පෞද්ගලික පුද්ගලයින් විසින් හෝ සිදු කෙරෙන්නා වූ සියලුම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් වළක්වා ගැනීමට විමර්ශනය කිරීමට සහ අත්අඩංගුවට ගැනීමට නීති බලාත්මක කරන්නා වූ නිලධාරීන් නිසි සම්ප්‍රජනාතාවයෙන් යුක්තව ක්‍රියා කළ යුතුයැයි සඳහන් කර තිබේ. එසේම 2023 අංක10 දරන වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනතේ තුන්වන කොටසේ 1 (a) ප්‍රකාරව, අපරාධ වින්දිතයෙකුගේ අයිතිවාසිකම් සඳහන් කරමින් ඔවුන්ට සමානාත්මතාවයෙන් හා සාධාරණව සැලකිය යුතු බවටත් ගරුත්වය හා පෞද්ගලිකත්වය සුරැකෙන පරිදි සැළකීමට අයිතියක් පවතින බවටත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන දක්වා ඇත. මේ අනුව පැමිණිලිකාරිය අපරාධ වින්දිතයකු වශයෙන් ඇයට හිමි විය යුතු නෛතික රැකවරණය පොලිසිය ස්ථානය තුළදී හෝ ලබාදීමට වගඋත්තරකාර 1,2,3,4,5 නිලධාරීන් අසමත්ව ඇත.
ඒ අනුව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති නීතිය පසිඳලීම ක්‍රියාත්මකවීම කිරීම හා රැකවරණය සාර්වසාධාරණ විය යුත්තේය යනවා මූලික අයිතිවාසිකම් පැමිණිකාරිය සම්බන්ධයෙන් වග උත්තරකරුවන් විසින් උල්ලංඝනය කොට ඇත.

- 01 වගඋත්තරකරු පවසන පරිදි පැමිණිලිකාරිය ප්‍රශ්නගත සිදුවීමෙන් මාස තුනකට පසු එම සිදුවීම පිළිබඳව ඉහල බලධාරීන්ට පැමිණිලි කිරීම තුලින් නීතිඥවරුන්ගේ උපදෙස් පරිදි වෛවාහක සහනයක් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේ අසත්භාවී චේතනාවක් නිරීක්ෂණය නොවේ. මක්නිසාදයත් එම සිදුවීමෙන් දින කීපයකට පසුව 2020.03.19 දින කොවිඩ් 19 හේතුවෙන් සංචරණ සීමා පැනවීම සිදුවූ බවත් 2020.05.30 ආසන්න දිනක එකී සංචරණ සීමා අර්ධ වශයෙන් ලිහිල් කල බවත් ඉන්පසුව 2020.06.11 වනදින පැමිණිලිකාරිනිය මෙම සිදුවීම සම්බන්ධයෙන් බලධාරීන්ට පැමිණිලි කර බවත් නිරීක්ෂණය වේ. අනෙක් අතට වැදගත්වන්නේ පැමිණිල්ලේ සඳහන් කරුණු සත්‍යද අසත්‍යද යන්න මිස උපකල්පන නොවේ.

- අනුරාධපුර නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ නියමය අනුව විශ්‍රාමලත් පොලිස් අධිකාරී පියසේන පෙරේරා මහතා විසින් 02 වගඋත්තරකරු වන කේ. විතානගේ මයා, 03 වග උත්තර කරු වන උ.පො.ප සංජීවනි පෙරේරා මිය,04 වග උත්තර කරු වන පො. කො ඒකනායක මයා, යන නිලධාරීන්ට විරුද්ධව නිකුත් කර ඇති චෝදනා පත්‍ර පිළිබඳව ආයතන සංග්‍රහයේ පරිච්ඡේද 11.1 ප්‍රතිපාදන ප්‍රකාරව විනය පරීක්ෂණ පවත්වා අවසාන වාර්තාවක් ඉදිරිපත් කොට ඇත. මෙම අවසන් වාර්තාව තුළ සිද්ධිය සැකෙවින් යන ශීර්ෂ යටතේ පැමිණිලිකාරිය සම්බන්ධව අපහාසාත්මක භාෂාවක් හා පැමිණිලිකාරිය තවත් පුරුෂයෙකු හා එම ස්ථානයේ සිටි බව තහවුරු කරගත් ගත් සාක්ෂි කිසිත් නොමැති තත්ත්වයක් යටතේ පැමිණිලි පාර්ශ්වයට අගතිදායක වන පරිද්දෙන් කරුණු වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ. මෙම ප්‍රශ්නගත වාර්තාවේ නිරීක්ෂණය යන ශීර්ෂය යටතේ කාන්තා පාර්ශවය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික පැරණි මතවාදී යෙදුම් භාවිතා කරමින් එසේම පැමිණිකාරියගේ පෞරුෂ ලක්ෂණ විවේචනයට ලක් කරමින් පුද්ගල බද්ධ ස්වරූපයෙන් කරුණු දක්වා ඇත. විනය පරීක්ෂණයක වාර්තාවක් යන හුදු පෞද්ගලික ඇගයුම් වාර්තාවක් නොවන අතර පරිපාලන නීතියේ මූලධර්ම අනුගමනය කරමින් සැකසිය යුතු නෛතික වැදගත්කමකින් යුත් වාස්තවික කරුණු දැක්වීමක් විය යුතුය. මේ අනුව මෙම පරීක්ෂණ වාර්තාව තුළින්ද පැමිණිකාරිය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ දැක්වෙන අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම සිද්ධිය සමස්ත ලෙස ගත්කළ පහත කරුණු අනාවරණය වේ.

1. පැමිණිලිකාරිය 2020.03.13 දින ඉපලෝගම රන්දියත හෝටලයේ නැවතී සිටියදී, ඇයගෙන් වෙන්වී සිටින ස්වාමිපුරුෂයා වූ මිලංග ගජනායක යන තැනැත්තා තවත් කීපදෙනෙක් සමඟ පැමිණ හෝටලයට බලෙන් ඇතුළුව, එහි සේවකයකුට පහරදී පැමිනිලිකාරිය නැවතී සිටි කාමරයේ දොර කඩා ඇතුළු වී ඇති බව.

2. ඒ බව කළමනාකරු විසින් 119 අංකයට කතාකර තම හෝටලයට බලෙන් පිරිසක් ඇතුළුවී හිරිහැර කරන බව දැන්වූ බව ඔහු ප්‍රකාශ කර ඇති අතර මිලංග ගජනායක විසින්ද 119 අංකයට කතාකර දන්වා ඇත.මිලංග ගජනායකගේ දැනුම්දීම සටහන් කර තිබුනද රන්දියත හෝටලයේ කළමනාකරුගේ දැනුම්දීම ඉපලෝගම පොලිසිය සටහන් නොකිරීම තුල මෙය සැලසුම් කරන ලද ක්‍රියාවක් ලෙස සැලකීමට හැකියාවක් උදාවී ඇත.

3. ඉපලෝගම පොලිසිය පවසන පරිදි පැමිනිලිකරු අනාචාරයේ හැසිරුනු බවට වන අපරාධමය නොවන පැමිනිල්ලකට පොලිසිය අපමණ උද්යෝගයකින් මැදිහත් වී ඇති බවද නිරික්ෂණය වේ.

4. අදාළ ඉපලෝගම රන්දියත හෝටලයට මධ්‍යම රාත්‍රියේ සාපරාධී බලෙන් ඇතුළු වී ඇති බව, එහි මුරකරුටද පහරදී ඇති බව හා කාමරයේ දොර හා ජනෙල් කඩා ඇති බව පැහැදිලි සාක්ෂි හා පෙනීමට තිබියදී ඊට අදාල තැනැත්තා අත්අඩංගුවට ගතයුතු වුවද , එසේ අතඅඩංගුවට නොගෙන, හෝටලයේ කළමනාකරුට සැකකරුවන් විසින් සිදුවී ඇති අලාභය සඳහා මුදලක් ගෙවීම මතම සියලු අපරාධ ක්‍රියා වසන් කර, ඒ වෙනුවට හිරිහැරයට පත්කර තිබූ පැමිණිලිකාර වින්දිත තැනැත්තා පොලිසිය අත්අඩංගුව ගෙන ඇතිබව පෙනේ.පැමිණිලිකාරියගේ ආරක්ෂාවට රැගෙන ගිය බව වගඋත්තරකරුවන් සඳහන් කළද , ඔවුන් ක්‍රියාකර ඇති ආකාරය එසේම ලේඛන සටහන් අනුව " ඇය ඇප මුදා හැරි බව කීම " ආදී කරුණු මඟින් පැමිණිලිකාරිය අත්අඩංගුවට ගෙන ඇති බව තහවුරුවේ.

5. අදාල සිද්ධියට සම්බන්ධ සැකකරුවන් පොලීසියට රැගෙන ගිය බවට හෝ සාක්ෂි හෝ සටහන් නොමැත.

6. අදාල සිද්ධියේ සැකකරුවන් විසින් පැමිණිලිකාරිය වීඩියෝ ගතකර ඡායාරූප,ජංගම දුරකථන මඟින් ගෙන ඒවා ප්‍රසිද්ධියට පත්කර ඇති බවද ඒ මඟින් කාන්තාවක් වන පැමිණිලිකාරිය අගතියට පත්ව ඇති බවද පෙනියන අතර එම ඡායාරූප ගත කිරිම පොලිස් නිළධාරීන් සිටියදී හෝ පොලිසිය තුලදී සිදුකල බවට කරුණු අනාවරණය වන අතර එය වැළක්වීමට හෝ අදාල තැනැත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට පොලිස් නිළධාරීන් ක්‍රියාකර නැත.

7. පැමිනිලිකාරිය සමූහ දූෂණයට ලක්කිරීමට සූදානම් වූ බව හා ක්‍රිකට් පිත්තක්ද යොදා ගනිමින් ලිංගික හිංසන කරනු ලැබූ බවට පැමිණිලිකාරිය විසින් කරනු ලැබූ පැමිණිල්ල භාර නොගත් බව පැමිණිලිකාරිය ප්‍රකාශ කරන අතර , එවැනි පැමිනිලි නොකළ බව වගඋත්තරකාර පොලිස් නිළධාරීන් ප්‍රකාශ කර ඇත. පැමිනිලිකාරිය පොලිස්පතිවරයා ඇමතූ ලිපියේ හා පසුව කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යංශයේ පොලිස් නිළධාරීන්ට කල ප්‍රකාශ අනුව මිලංග ගජනායක ඇතුළු සැකකරුවන් බලහත්කාරයෙන් හෝටල් පරිශ්‍රයට ඇතුළුව ක්‍රිකට් පිත්තකින් රන්දියත හෝටලයේ සේවක මහින්ද ප්‍රේමලාල් ඒකනායකට පහර දුන් බව එම පහරදීමට ලක්වූ තැනැත්තා විසින්ම ප්‍රකාශ කර තිබීමද ඒ සම්බන්ධව ඉපලෝගම පොලිසිය ක්‍රියාකර නොතිබීමද එකී පැමිණිල්ල හෝ සටහන් නොකිරීමද අදාල ක්‍රිකට් පිත්ත විශේෂ විමර්ශන ඒකකයේ නිළධාරීන් සොයා ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබීමද යන කරුණු මත පැමිණිලිකාරියගේ ප්‍රකාශය වඩා විශ්වාසනීය වේ.

8. පොලිස් ස්ථානයක කාන්තා හා ළමා කාර්යාංශයක් පිහිටුවන්නේ ළමයින් හා කාන්තාවන් සම්බන්ධ පැමිණිල්ලකදී වඩා සංවේදී වෙමින් හා කාර්යක්ෂමව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා වුවත්, මෙහිදී ඉපලෝගම පොලිස් ස්ථානයේ කාන්තා හා ළමා කාර්යාංශයේ ස්ථානාධිපතිධූරය දැරූ 03 වන වගඋත්තරකාරිය එම වගකීම නොසළකා හරිමින් පැමිනිල්ල සමථ කර බවට සටහන් කර ඇති සටහන මෙන්ම පවුල් ආරවුලක් ලෙස සළකා මෙම අපරාධමය වරද නොසලකා හැරීම මගින්ද තම නීතිමය රාජකාරී වගකීම පැහැරහැර ඇති බව නිරීක්ෂණය වේ.

9. එකී සමථ සටහනේ සටහන් මගින් පැමිනිලිකාරියගේ රන්මාලය සැකකාර මිලංග ගජනායක කඩාගත් බව පිළිගෙන ඇති බව පෙනීයන අතර, එය ලබා දෙන බවට එකඟ වූ බවට සටහනක් මගින් පැමිණිලිකාරියගේ රන් ආභරණ බලෙන් පැහැර ගෙන ඇති බව හා හිංසනය පිලිබද කරුණු පැහැදිලි වේ.එහිදීද ඉපලෝගම පොලිසියේ ළමා හා කාන්තා කාර්යංශයේ ස්ථානාධිපතිවරයා ඒ සම්බන්ධව වෙනත් කිසිදු පියවරක් ගෙන නොමැත.

10. තම ප්‍රකාශ ලෙස ඉපලෝගම පොලිසියේ පොලිස් නිළධාරින් විසින් සටහන් කර දක්වන ලද ප්‍රකාශ වලට අත්සන් කිරිමට බළකර සිටි බවත්, අත්සන් නොකළහොත් අධිකරණයට වාර්තා කර රක්ෂිත බන්ධනාගාර ගතකිරීමට සිදුවන බවට තර්ජනය කල බවට පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. ඒ අවස්ථාවේ බියට පත්ව සිටි පැමිණිලිකාරිය පොලිස් ස්ථානයෙන් හැකි ඉක්මනින් පිටත්ව යාමේ අවශ්‍යතාවය මත අත්සන් කර සිටි බවත්, පැමිනිලිකාරිය තම දිවුරුම් පෙත්සම මගින් ප්‍රකාශ කර ඇත. තමාගෙන් වෙන්වී සිටින ස්වාමිපුරුෂයා වූ මිලංග ගජනායක ඇතුළු පිරිසගේ පහරදීමට හා ලිංගික හිංසනයට මධ්‍යම රාත්‍රියේ මුහුණපා පොලිසිය මගින්ද නීතිමය සාධාරණය නිසි ලෙසත් ඉටු නොවූ හා හුදකලාව හා බියට පත්ව සිටි අවස්ථාවක පැමිණිලිකාරිය යම් බලපෑමකට අවනත වීම වටහා ගත හැකි කරුණක් වේ.

11. ඉපළෝගම පොලීසියම ප්‍රකාශ කරන පරිදි අපරාධමය වරදක් නොවන 119 ලැබුණු අනාචාරයේ හැසිරීම සම්බන්ධ පැමිණිල්ලකට ක්‍රියාකර ඇති ආකාරය හා උද්යෝගීමත්භාවය, වෘත්තීමය පොලිස් නිලධාරීන්ගෙන් අපේක්ෂා නොකරන තත්ත්වයක් බවද, ඉපලෝගම පොලිස් නිළධාරින්ගේ එම සමස්ත ක්‍රියා කලාපය නීතියට පටහැනි වන බවද නිරීක්ෂණය වේ.

12. මේ සම්බන්ධව උතුරුමැද නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් අදාළ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට නිටපු ජේෂ්ඨ පොලිස් අධිකාරිවරයකු වන පියසේන පෙරේරා නැමති අය පත්කර විනය පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ලබාගෙන ඇත. එකී වාර්තාව පොලිස් නිලධාරීන්ට පක්ෂපාති හා සාක්ෂි නිසි ලෙස සලකා නොබැලූ එකක් සේම, පැමිණිකාරියගේ චරිතය ඝාතනය වන ආකාරයට කාන්තාවන් කෙරෙහි පරිභවයෙන් යුතු විමර්ශන වාර්තාවකට නොගැළපෙන වාක්‍ය වලින් යුතු තමන් කාන්තාවන් කෙරෙහි දක්වන මානසික අගතිගාමී බව පිළිබිඹු කරන බව, එකී වාර්තාව අධ්‍යයනයේදී පෙනී යයි. කෙසේ වෙතත් නිවැරදි ලෙසට නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් එකී වාර්තාව ප්‍රතික්ෂේප කොට ඇත.

13. ඉපලෝගම පොලිසියෙන් අදාළ වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාරියගේ සිද්ධියට සම්බන්ධ කිසිදු තැනැත්තකුට කිසිදු චෝදනාවක් අධිකරණයක් වෙත ඉදිරිපත් කර නොමැති අතර, පසුව කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යංශයේ විසින් මිලංග ගජනායක ඇතුළු එම තැනැත්තන්ට විරුද්ධව අධිකරණය හමුවේ සමූහ දූෂණයට උත්සාහ කිරීම හා ලිංගික හිංසනය ඇතුළු චෝදනා ගොනු කර ඇති බවද නිරීක්ෂණය වේ.

14. පැමිණිලිකාරියගේ ප්‍රකාශය (පැමිණිකාරිය ප්‍රකාශ කරන පරිදි තර්ජනය කර අත්සන් කරවා ගැනීම හා සමථය සටහන් කිරීමේදී පැමිණිලිකාරිය අනාචාරයේ හැසිරෙන බවට (වෙනත් අනියම් සබඳතා පවතින බව) සටහන් කිරීම තුළ පැමිණිලිකාරිය " අවමන් සහගත සැලකිල්ලකට" පත්කර ඇති බව අනාවරණය වේ.

15. මෙම සියලු කරුණු අනුව පැමිණිලිකාරියට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11,12(1),13,(1),13(2) ව්‍යවස්ථා මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමු.

16. මේ පිළිබඳව පොලිස් ස්ථානාධිපති පළමු වගඋත්තරකරු විසින් නිසි අධීක්ෂණයක් කර නොමැති අතර සිද්ධියට අදාළ කරුණු හා සටහන් හා සාක්ෂි පිළිබඳව අවධානය යොමු නොකිරීමෙන් තම අධීක්ෂණ වගකීම පැහැරහැර ඇත. දෙවන වගඋත්තරකරු අත්අඩංගුවට ගැනීම රඳවා තබා ගැනීම හා අදාළ සැකකරුවන්ට විරුද්ධව නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සිදුකොට නොමැත. තුන්වන වගඋත්තරකාරිය ඉපලෝගම පොලිසියේ කාන්තා හා ළමා කාර්යාංශයේ ස්ථානාධිපති ලෙස තම වගකීම පැහැර හරිමින් පැමිණිලිකාරියට අවමන් සහගත සටහන් යොදමින් හා අනෙක් වගඋත්තරකරුවන්ගේ නීතියට පටහැනි ක්‍රියා කලාපයට සහාය වී ඇත.03,04,05 වග උත්තර කරුවන් පැමිණිලිකාරී අත්අඩංගුවට ගැනීම රඳවා තබා ගැනීම සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇති අතර පැමිණිලිකාරියට හිරිහැර කළ අදාළ සැකකරුවන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට පියවර ගෙන නොමැත. ඒ මගින් 1-6 දක්වා වගඋත්තරකරුවන් සියලු දෙනාම වෙන් වෙන්ව හා එක්ව පැමිණිලිකාරියට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11,12(1),13(1),13(2) ව්‍යවස්ථා මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇත.

17. ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් කර සිටී,

I. පැමිණිලිකාරිය වෙත,

a) පළමු වග උත්තරකරු විසින් රු .50,000/= ක මුදලක්ද,
b) දෙවන වග උත්තරකරු විසින් රු 100,000/= ක මුදලක්ද
c) තුන්වන වග උත්තරකාරිය විසින් රු. 50,000/= ක මුදලක්ද
d) හතරවන පස්වන හා හයවන වගඋත්තරකරුවන් විසින් එක් අයෙක් රු. 10,000/= බැගින්වූ රු.30,000/= ක මුදලක්ද ගෙවිය යුතුය.

II. පොලිස්පතිවරයා විසින් මෙම සිද්ධිය පිළිබඳ අපක්ෂපාතී, විධිමත් පරීක්ෂණයක් කිරීමට කටයුතු කළ යුතුය.

111 තවදුරටත් පොලිස්පතිවරයා විසින් පොලිස් ස්ථානවල කාන්තා හා ළමා කාර්යාංශ නිලධාරීන්ට ඔවුන්ගේ වගකීම හා කාර්යභාරය පිළිබඳ පුහුණු සැසි පැවැත්වීමට සුදුසු පියවර ගත යුතු අතර තුන්වන වගඋත්තරකාරියට එක් මාසයක විශේෂ පුහුණුවක් ලබා දිය යුතුය.

1v පැමිණිලිකාරියට කරනු ලැබූ අපරාධමය වැරදි සියල්ල සම්බන්ධව එකී අදාළ නිලධාරීන් විසින් සැකකරුවන්ට විධිමත් චෝදනා ගොනු කර අධිකරණයේ නඩුකටයුතු පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගත යුතුය.

v ඕද්ධියට අදාළ තොරතුරු සටහන් පොත්වල පැමිණිලිකාරිය සම්බන්ධව අගතිගාමී (අසත්‍ය) සටහන් යෙදීම පිළිබඳව අදාළ නිලධාරීන්ට නීති ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. විනය පරීක්ෂණ නිලධාරී හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පියසේන පෙරේරාගේ ක්‍රියා කලාපය පිළිබඳ සුදුසු පියවර ගතයුතු අතර ඔහු තවදුරටත් විනය පරීක්ෂණ සඳහා යොදවා ගැනීම සම්බන්ධව නැවත සලකා බැලිය යුතුය.

**2025.03.** 20 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට **1996** අංක **21** දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ **15 (7)** වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

**එල්.ටී.බී.දෙහිදෙණිය,**
**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ( හිටපු),**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**නිමල් ජී.පුංචිහේවා,**
**කොමසාරිස්,**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත -

1. අමාත්‍යතුමා
   මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
   14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල
   - සුදුසු පියවර ගැනීමට

2. පොලිස්පතිතුමා,
   පොලිස් මූලස්ථානය,
   කොළඹ 01.
   - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

3. අධ්‍යක්ෂ,
   පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
   අංක 7, 7 වන මහල, කොටා ටෙරස්,
   එන්.එම්.පෙරේරා මාවත,
   කොළඹ 08.